# මෙත් සවිය

**මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය**

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව * 2017 මාර්තු * මෙත් සවිය දහ හතර වන කාණ්ඩය * තිස් වන කලාපය

METHSAVIYA NEWSLETTER

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා




ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.

ඇස්තමේන්තු ගත මුදල
**රුපියල් ලක්ෂ 350 ක්**
පමණ වේ.

වර්ෂ 2016 සැප්තැම්බර් මස දී ගන්නා ලද බුද්ධප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ ඡායාරූප කිහිපයක්...







**මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න**

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❊ 2017 මාර්තු ❊ මෙත් සවිය දහ හතර වන කාණ්ඩය ❊ තිස් වන කලාපය


## මෙත් සවිය 2016 වසර සඳහා පත් වූ විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත, වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක
අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා
අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී
මහාචාර්ය චන්දන ජයරත්න මහතා.
දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපතිවරු**

වෛද්‍ය කාංචන ඇලපාත මහතා.
වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා.

**ගරු සම ලේකම්වරු**

එච්. එම්. චින්තක බණ්ඩාර මහතා.
දු.ක : 0718114477
කෝසල එදිරිසිංහ මහතා.
දු.ක : 0716322306

**ගරු භාණ්ඩාගාරික**

චමින්ද ඉන්දික මහතා.
දු.ක : 0712299212

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා.

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා
දු.ක : 0712285680

**ගරු කාරක සභිකවරු**

සම්පත් රත්නතිලක මහතා
මෙනුර ඩයස් මහතා
දර්ශන ගලප්පත්ති මහතා
ඩබ්. පී. සී. විතාන මහතා
ජගත් ප්‍රසන්න මහතා
ප්‍රදීප් යහම්පත් මහතා

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

මංජුල පද්මකුමාර මහතා

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය

**තරුණ කමිටුව - සභාපති**

ප්‍රසාද් අබේසිංහ මහතා

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

ශ්‍යාමා සමරවීර මෙනවිය

**සුව සෙත කමිටුව - සභාපති**

ප්‍රභාත් විජේසිංහ මහතා

**අධීක්ෂණ කමිටුව**

ජී. ජී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහතුනකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි**. වර්තමාන සාමාජික සංඛ්‍යාව 5,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය පවත්වා ගනිමින් **"මෙත් සවිය"** මෛත්‍රී සංසදය පසුගිය දහතුන් වසර පුරා සමථ විපස්සනා භාවනාව පන් දහස් පන්සියකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 2017 මැයි 07 වන ඉරු දින මාසික රැස්වීම

සෑම මසකම පළමුවැනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන් ම (දාන - සීල - භාවනා වැඩසටහන් සඳහා සදහම් චාරිකාවේ නොයෙදෙන දිනයන් හිදී) මාසික රැස්වීම සහ විශේෂ දේශනය කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීම් ලැබුන ද, නොලැබුන ද, සෑම මසක ම පළමුවැනි ඉරුදින ඉහත මාසික රැස්වීම වැඩසටහන් සඳහා ප.ව. 2 - 4 අතර කාලය තුළ පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

අපගේ මීළඟ ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන 2017/05/07 දින, ප.ව. 2 - 3 දක්වා **"ලෝක විෂය, විශ්වයේ සම්භවය, ලෝකයේ සත්ත්වයාගේ හටගැනීම හා ලෝක විනාශය බුදු නෙතින් හා විදු නෙතින්"** දේශනය මහාචර්ය චන්දන ජයරත්න මහතා විසින් පවත්වන අතර ඉන් පසුව ප.ව. 3 - 4 දක්වා **දොලොස්වල උදිතධීර ස්වාමීන් වහන්සේ විසින් ධර්ම දේශනය** පැවැත්වීමට නියමිත ය.

## 2017 ජුනි 04 වන ඉරු දින මාසික රැස්වීම

දොරමඩලාවෙන් නිතර හමුවන මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ මහතා විසින් පවත්වනු ලබන **'විශේෂ දේශනය"** ප.ව. 2 - 4 දක්වා කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. මෙම දේශනයට සියළු දෙනාගේම පැමිණීම බලාපොරොත්තු වේ.

## 2017 ජුනි 11 වන දින වෛද්‍ය කඳවුර

පොසොන් පොහොයට සමගාමීව, විශේෂඥ වෛද්‍යවරුන් සහභාගී වන නොමිළයේ රෝග විනිශ්චය කර බෙහෙත් ලබා දෙන මෙත් සවිය වෛද්‍ය කඳවුර වැල්ලවත්ත, ශ්‍රී විජයාරාමයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පැවැත්වේ. සියළු සාමාජිකයින් සහ සාමාජිකයින්ගේ පවුල් වල අයටත්, අසල්වාසී අසරණ අයටත් පැමිණ ප්‍රතිකාර ලබාගත හැක. මෙයට ශ්‍රම දායකත්වය සැපයිය හැකි මෙත් සවිය වෛද්‍ය වරුන් හෝ හෙදියන් වෙත්නම් මහාචාර්ය චන්දන ජයරත්න මහතා (0714 800 800) හෝ කාර්යාලය (0714 014467) අමතන්න.

## 2017 ජූලි 02 වන දින සදහම් චාරිකා වැඩසටහනේ මහියංගනයේ දී දාන-සීල-භාවනා වැඩසටහන සහ දඹාන ආදී වාසින් වෙත ගොස් කරන පරිත්‍යාග

මහියංගනය රාජ මහා විහාරයේ බුදු පිළිම නිරීක්ෂණ චාරිකාව හා දඹාන ආදිවාසී ජනතාව වෙත නිවාස සෙවිලි කරන ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම 2017 ජූලි 01 වන සෙනසුරාදා රාත්‍රී 10.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් සුඛෝපභෝගී බස්රථ මගින් පිටත් වේ. පසුදින (ඉරුදින) රාත්‍රී 9.00 ට ප්‍රථම නැවත කොළඹට පැමිණීමට බලාපොරොත්තු වේ. පවුලේ සාමාජිකයන්හට ද සහභාගී විය හැක. සිල් ගැනීමට සුදුසු ඇඳුමෙන් පැමිණෙන්න.

## 37 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

37 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2017 ජූලි මස 16 වන දින ඇරඹීමට නියමිතය.

## මීළඟ 10 දින නේවාසික භාවනා වැඩසටහන අගෝස්තු පාසැල් නිවාඩු කාලය තුල පැවැත්වීමට බලාපොරොත්තු වේ.

## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

## මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එළ කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එළ කරනු ලබන දැන්වීම් 2017 - 05 -15 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

## පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

## සුව සෙත

ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින් රෝග සුවකිරීමේ නොමිලයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන ඉරු දිනවල දී,

පෙ.ව. 11.00 - 2.00 දක්වා
(මාසයේ පළමු ඉරු දින හැරෙන්නට)
ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ.

කාර්යයාලයෙන් විමසා පැමිණෙන්න.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 13 වන සංවත්සර වාර්තාව

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 03 වන ඉරු දින පස්වරු 1.30 කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂි බෞද්ධාශ්‍රම ශාලාවේදී, මෙත්සවිය සංසදයේ දහතුන්වෙනි සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ උපහාර ප්‍රධානෝත්සවයේ සමාරම්භක උළෙල උත්කර්ශවත් අයුරින් ඇරඹුනි. මෙහිදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ වර්තමාන කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමාට සහභාගී වීමට නියමිතව තිබුණු නමුදු නොවැලක්විය හේතුවක් මත එතුමාට පැමිණීමට නොහැකි විය. එතුමා ලිපියක් මඟින් එතුමාගේ සුභාශිංසනය දන්වා එවන ලදී.

ප.ව. 2.00 ට මෙත්සවිය සංසදයේ 13 වන සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ උපහාර ප්‍රධානෝත්සවයේ සමාරම්භය සනිටුහන් කරමින් මෙත්සවිය සංසදයේ ගරු සභාපති නාලන්දා කීර්ති ශ්‍රී, ශාසනදීපන, විද්‍යාකීර්ති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් විසින් පංචතූර්ය, ජයසක් නාද මධ්‍යයේ ආරාධිත අමුත්තන් සහ මෛත්‍රී භූෂණ ලාභීන් සභාගැබ වෙත කැඳවාගෙන එන ලදි.

අනතුරුව සාම්ප්‍රධායානුකූලව පොල්තෙල් පහන් දැල්වීම හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඥාණිස්සර ස්වාමීන් වහන්සේ වෙත මූලාසනය පිළිගැන්වීම සිදුවිය. උන් වහන්සේ විසින් පැමිණ සිටි පිරිස ආජීව අෂ්ඨමක ශීලයේ පිහිටුවන ලද අතර පසුව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ගරු අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ කෙටි අනුශාසනාවක් පවත්වා පැමිණ සිටි පිරිසට සහ මෙත්සවිය සියලූ සාමාජිකයින්ට ආශිර්වාද කරන ලදි. ඉක්බිතිව මෙත්සවිය සංසදයේ සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් විසින් ආරාධිත අමුත්තන් ඇතුළු පැමිණ සිටි සියළු දෙනා මෙත් සිත් පෙරදැරිව පිළිගන්නා ලදි.

මෛත්‍රී භූෂණ සම්මාන ප්‍රධානය කිරීම මින් අනතරුව ආරම්භ විය. පළමුව මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ට සේවය හා ප්‍රවීණත්වය උදෙසා පිරිනැමෙන මෙත්සවිය මෛත්‍රී භූෂණ ගෞරව උපහාර සම්මානය වන මෛත්‍රී භූෂණ ශ්‍රී සද්ධර්ම චක්‍රවර්ති ගෞරව නාම සම්මානය ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඥාණිස්සර ස්වාමීන් වහන්සේ වෙත පිරිනැමීම, අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේ සහ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සිදුකරන ලදි. දෙවනුව මෙත්සිත් මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ට සේවය හා ප්‍රවීණත්වය උදෙසා පිරිනැමෙන මෙත්සවිය මෛත්‍රී භූෂණ ගෞරව උපහාර සම්මානය වන මෛත්‍රී භූෂණ වෛද්‍ය චක්‍රවර්ති ගෞරව නාම සම්මානය පූජ්‍ය අම්තිරිගල පාලිත ධම්ම ස්වාමීන් වෙත පිරිනැමීම ද, අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේ සහ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සිදුකරන ලදි. පසුව මෛත්‍රී භූෂණ ලාභී ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙන ඥාණිස්සර ස්වාමීන් වහන්සේ විසින් හරවත් අනුශාසනාවක් පවත්වා සියලූ දෙනාට ආශිර්වාද කරන ලදි. දෙවනුව පූජ්‍ය අම්තිරිගල පාලිතධම්ම ස්වාමීන් වහන්සේ උන්වහන්සේ විසින් ද දේශනාවක් පවත්වා පිරිසට ආශිර්වාද කරන ලදි.

ඉනික්බිතිව හොරණ විදුසිළු රංගායතනයේ දරුදැරියන් විසින් විචිත්‍රවත් නර්තනයක් ඉදිරිපත් කරන ලදී. පසුව මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් ගරු කථානායක තුමාගේ පණිවිඩය සභාවට ඉදිරිපත් කරන ලදි. මෙත්සවිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානය මීළඟට ආරම්භ විය. මෙහිදී අසරණ පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් 17 දෙනෙක් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව හා අධ්‍යාපන උපකරණ කට්ටලයක් ලබාදීම මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් විසින් සිදු කිරීමට යෙදුනි.

මෙත්සවිය සංසදයේ උන්නතිය උදෙසා නිලතල තනතුරු නොමැතිව අපරිමිත කැපවීමකින් කටයුතු කරන සාමාජිකයින් ඇගයීම සඳහා විශේෂ ඇගයීමේ සම්මාන ලබාදීම මීලගට සිදුවිය. මෙහිදී තමරා සමරදීර, ශ්‍යාමා සමරදීර, අයිමා ජයවීර, පියදාස සිල්වා සහ ප්‍රියන්ත මුතුතන්ත්‍රී යන මහත්ම මහත්මීන් ඇගයීමට ලක් කෙරුණි. තවද මෙත්සවිය කමිටු සාමාජිකයින් සහභාගී වූ නායකත්වය සහ පුද්ගල සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සාර්ථකව නිමකළ සාමාජිකයින්ට සහතික පත්‍ර පිරිනැමීම මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා සහ වැඩමුළුවේ ප්‍රධාන සම්පත් දායකයා වූ ප්‍රියන්ත මුතුතන්ත්‍රී මහතා අතින් සිදුවිය.

මීළඟට මෙත්සවිය මාසික ධර්ම දේශනාව පූජ්‍ය තුම්බෝවිල යසස්සී ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලදී. මෙයින් අනතුරුව පැමිණ සිටි සියළු දෙනා සඳහා තේ පැන් සංග්‍රහයක් පැවැත්වීමෙන් පසුව මෛත්‍රී භූෂණ සම්මාන උළෙලේ නිමවා සිදුවිය.

## මෙත්සවිය
## 13 වෙනි මහ සමුළුවේ වාර්තාව

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 03 වන ඉරු දින පස්වරු 5.00 කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂි බෞද්ධාශ්‍රම ශාලාවේදී, මෙත්සවිය 13 වන මහා සමුළුව ගරු පැවිදි අනුශාසක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේද, මෙත්සවිය නිර්මාතෘ, මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. පළමුව 12 වන සංවත්සර වාර්තාව මෙත්සවිය සංසදයේ ගරු සභාපති තුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලැබිනි. එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට චමින්ද ඉන්දික මහතා යෝජනා කල අතර පී. පී පෙරේරා මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන් පසුව මෙත්සවිය 2015/2016 වර්ෂය තුල සිදු කෙරුණු ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් සභාවට ඉදිරිපත් කල අතර එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සුරංග ලියනගේ මහතාගේ හා රන්ජිත් සොයිසා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පිළිගනු ලැබුණි. අනතුරුව මෙත්සවිය සංසදයේ ගරු උප භාණ්ඩාගාරික ඉන්දික තෙන්නකොන් මහතා විසින් 2015 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමට යෙදුනි. ඉදිරිපත් කල අයවැය වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සුරංග ලියනගේ මහතාගේ හා ඩබ්ලිව්.ඩී.සී පෙරේරා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

අනතුරුව මෙත්සවිය ව්‍යවස්ථානුකූලව මෙත්සවිය සංසදයේ සභාපති තුමා ඇතුළු නිලධාරී මණ්ඩලය දරණ තනතුරුවලින් ඉල්ලා අස්වූ අතර ඉදිරි වසර සඳහා මෙත්සවිය සංසදයේ සභාපති ලෙස මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා තෝරා පත් කර ගන්නා ලදි. තවද උපසභාපති වරුන් ලෙස වෛද්‍ය කාංචන ඇලපාත මහතා හා වෛද්‍ය එම්. ඒ. චන්දිම මාරසිංහ මහතා ද සම ලේකම් තනතුරු සඳහා චින්තක බණ්ඩාර මහතා සහ කෝසල එදිරිසිංහ මහතා ද භාණ්ඩාගාරික ලෙස චමින්ද ඉන්දික මහතාද උප භාණ්ඩාගාරික ලෙස ඉන්දික තෙන්නකෝන් මහතාද සංස්කාරක ලෙස එම්. කේ ප්‍රියන්ත මහතාද තෝරා පත් කරගන්නා ලදි. කාරකසභික වරුන් ලෙස සම්පත් රත්නතිලක, මෙනුර ඩයස්, ඩබ්ලිව්.පී.සී විතාන, දර්ශන ගලප්පත්ති, සුරංග ලියනගේ, ජගත් ප්‍රසන්න යන මහත්වරුන් තෝරාපත් කරගන්නා ලදි. තවද වෙබ් කමිටු සභාපති ලෙස මංජුල පත්මකුමාර රණසිංහ මහතාද, බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස පී. ප්‍රේමදාස පෙරේරා මහතා ද, කාන්තා කමිටුවේ සභාපතිනිය ලෙස රංජිනී උඩුගොඩ මහත්මියද, තරුණ කමිටුවේ සභාපති ලෙස ප්‍රසාද් අබේසේකර මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිනිය ලෙස ශ්‍යාමා සමරවීර මෙනවියද, සුවසෙත කමිටුවේ සභාපති ලෙස ප්‍රභාත් විජේසිංහ මහතා තෝරාපත් කරගන්නා ලදි.

නිලධාරී මණ්ඩලය තෝරාගැනීමෙන් අනතුරුව මෙත්සවිය සංසදයේ සමාගම් ලේකම් ධූරය දැරූ දිනේෂ් අමරසූරිය මහතාද එම ධූරයෙන් ඉල්ලා අස් වූ අතර නව සමාගම් ලේකම්වරයා ලෙස රොබට් හේවගේ මහතා තෝරාපත් කරගන්නා ලදි. එසේම විගණනකවරුන් ලෙසට පෙර සිටි විගණනකවරුන් වන MKJ Associates (වරලත් ගණකාධිකාරීවරු) නැවතත් 2016 වර්ෂය සඳහාද ඒකමතිකව තෝරාපත් කරගන්නා ලදි.

## 2016 / 04 / 03 සිට 2017 / 04 / 02 කාලය දක්වා මෙත්සවිය මගින් සිදුකල ක්‍රියාකාරකම් වල සංක්ෂිප්ත වාර්තාව




- උතුම් වෙසක් පොහොය නිමිති කරගෙන මහරගම අපේක්ෂා රෝහලේ ළමා වාට්ටුව සඳහා කිරිපිටි, බෙහෙත්, සම්පාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පූජා කිරීම (20/5/2016).
- ප්‍රියන්ත මුතුතන්ත්‍රී මහතා මෙහෙයවූ පුද්ගල සංවර්ධන වැඩසටහන (5/6/2016).
- 34 වන භාවනා වැඩසටහනේ ආරම්භය (12/6/2016).
- මෙත්සවිය ත්‍රෛමාසික දාන සීල භාවනා වැඩසටහන පූජ්‍ය මඩවල උපාලි ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් බණ්ඩාරවෙල කිතල් ඇල්ල ආරණ්‍ය සේනාසනයේ පැවැත්වීම (3/7/2016).
- මෙත්සවිය මාසික පළමු ඉරුදින වැඩසටහන අරඹයා මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා පැවැත් වූ, විශ්වය සහ ලෝක විෂය බුදු නෙතින් සහ විදු ඇසින්, දේශනය සහ ඉන් අනතුරුව පූජ්‍ය තුම්බෝවිල ධම්මරතන ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනාව (7/8/2016).
- මෙත්සවිය දෙවන නේවාසික භාවනා පුහුණු වැඩසටහන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී ආරම්භ කිරීම (17/8/2016).
- මෙත්සවිය දෙවන නේවාසික භාවනා පුහුණු වැඩසටහන සාර්ථක ලෙස අවසන් කිරීම (26/8/2016).
- සතුන් නිදහස් කිරීමේ වැඩසටහනට අනුගාමීව සිරකරගෙන සිටි නාගයින් දෙදෙනෙක් නිදහස් කිරීම.
- පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ පැවැත් වූ මෙත්සවිය පළමු ඉරුදින ධර්ම දේශනාව (4/9/2016).
- මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මැතිතුමාගේ ජන්ම දිනය නිමිති කරගෙන මෙත්සවිය තරුණ කමිටුවේ මූලිකත්වයෙන් මහා සංඝරත්නය උදෙසා දානය පිරිනැමීම සහ විධායක කමිටුවේ මූලිකත්වයෙන් පැවැත්වූ අටවිසි බුද්ධ පූජාමය පිංකම (8/9/2016).
- මෙත් සවිය සංසදය මගින් සංවිධානය කරනු ලැබූ ලේ දන්දීමේ පිංකම වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේදී පැවැත්වීම (11/9/2016).
- පූජ්‍ය මීරාවත්තේ පඤ්ඤාසීල ස්වාමීන් වහන්සේ පැවැත්වූ පළමු ඉරුදින ධර්ම දේශනාව (2/10/2016).
- නියගයෙන් පීඩාවට පත් අනුරාධපුරය පොලොන්නරුව ආදී ප්‍රදේශවල ජනතාවට ජලය බෙදාදීම (15/10/2016).
- මෙත්සවිය 35 වන චිත්ත සංයමය භාවනා වැඩසටහනේ ආරම්භය (23/10/2016).
- මාසික පළමු ඉරුදින වැඩසටහන පිණිස මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා පැවැත් වූ, ලෝක විෂය, විශ්වයේ සම්භවය, ලෝකයේ සත්වයාගේ හටගැනීම හා ලෝක විනාශය බුදු නෙතින් හා විදු ඇසින් දේශනය (6/11/2016).
- ගම්පහ පාසාදික ස්වාමීන් වහන්සේ පැවැත්වූ මාසික පළමු ඉරුදින ධර්මදේශනය (6/11/2016).
- මාසික පළමු ඉරුදින වැඩසටහන සඳහා මහාචාර්ය දයා රෝහණ අතුකෝරාළ මහතා පැවැත් වූ, ජීවිතය ජයගන්නා අන්දම පිළිබඳ මනෝවිද්‍යාත්මක පුද්ගල ප්‍රවර්ධන දේශනය (4/12/2016).
- වසරේ ප්‍රථම හීල් දානමය පින් කම හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම සහ කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් කෑම ලබාදීම. පසුව ජයන්ති ළමා නිවාසයේ දරුවන් හුණුපිටිය ගංගාරාමයේ ආගමික වැඩ සටහන් සඳහා කැඳවාගෙන යාමට අවශ්‍ය ප්‍රවාහන පහසු කම් ලබා දීම (1/1/2017).
- මෙත්සවිය සියලු සාමාජිකයින්ට සෙත්පතා අටවිසි බුද්ධ පූජාමය පින්කමක් වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේදී පැවැත්වීම (1/1/2017).
- ත්‍රෛමාසික දාන - සීල - භාවනා වැඩසටහන මිහින්තලය කළුදිය පොකුණ ආරණ්‍ය සේනාසනයේදී පැවැත්වීම සහ නොමිලේ ඇස කන්නාඩි 186 ක් අසරණ ප්‍රදේශවාසීන් වෙත බෙදාදීම (5/2/2017).
- 36 වන චිත්ත සංයමය භාවනා වැඩසටහනේ ආරම්භක දිනය (26/2/2017).
- සාර්ථකව ඉගනගන්නා අන්දම සහ විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුව 750 ආසන්න පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ නව කලාගාර ශාලාවේදී පැවැත්වීම (5/3/2017).



# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2016. 09. 25 සිට 2017. 02. 26 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

**(ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)**

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-1046 | පද්මා පුංචිහේවා මිය | 22-3491 | 100 |
| 14/A-17996 | ශ්‍රියා ගමගේ මිය | 34-5218 | 100 |
| 14/C-0483 | සුමනා ප්‍රේමරත්න මිය | 20-3258 | 500 |
| 14/C-0484 | ජී. කුඩාගමගේ | 34-5312 | 500 |
| 14/C-0485 | අයෝම ප්‍රියදර්ශන මයා | 35-5429 | 500 |
| 14/C-0486 | නිහාල් පෙරේරා මයා | | 500 |
| 14/C-0487 | ඉනෝකා උදයරත්න මිය | | 500 |
| 14/C-0488 | ප්‍රේමා උදයරත්න මිය | | 500 |
| 14/C-0489 | සුනීතා චන්ද්‍රකීර්ති මිය | | 500 |
| KETA-0571 | හේලි අමා සෙනරත් | 05-1039 | 520 |
| KETA-0615 | ප්‍රභා තික්ශනී මිය | 04-0872 | 600 |
| 14/ D-0298 | කේ. ආර්. පි. දුල්වල මිය | 35-5462 | 1,000 |
| 14/ D-0297 | කේ. මුණසිංහ මයා | | 1,000 |
| 14/B-0076-0079 | එස්. එස්. ගීතාන්ජලි මිය | 28-4400 | 1,000 |
| KETA-0573 | එස්. ඒ. ඩී. මුදිත කුමාර මයා | 35-5386 | 1,000 |
| KETA-0574 | එම්. ඩී. ශෂිකලා නිසංසනි මිය | | 1,000 |
| 14/ D-0299 | ප්‍රියන්ත ද සිල්වා මයා | 31-4854 | 1,000 |
| 14/ D-0300 | ජයන්ත කෑරගල මයා | | 1,000 |
| 14/ D-0266 | මාලනි ජයසිංහ මිය | | 1,000 |
| 14/ D-0267 | බණ්ඩාර කරුණාතිලක මයා | | 1,000 |
| 14/ D-0268 | කුසලා අබේසේකර මිය | | 1,000 |
| 14/ D-0301 | හෂාන් ගුණසේකර මයා | | 1,000 |
| 14/C-0728-0729 | පි. එම්. සේනාධීර මයා | 11-2014 | 1,000 |
| KETA-0568 | ප්‍රියනාහක ඩී. සිල්වා මයා | 31-4854 | 1,500 |
| 14/A-16901-16917 | ජී. ඒ. එම්. සිල්වා මයා | 31-4847 | 1,700 |
| KETA-0578 | අමල් සිරි ද සිල්වා මයා | 32-4493 | 1,700 |
| 14/A-21376-21393 | එච්. එස්. නාලනී මිය | 17-2868 | 1,800 |
| KETA-0569 | අමල්සිරි ඩී. සිල්වා මයා | 32-4913 | 2,000 |
| KETA-0575 | ජී. ඩී. දේවප්‍රිය මයා | | 2,000 |
| KETA-0576 | දිස්නා රන්ජනී මිය | | 2,000 |
| KETA-0577 | නාලනී ජයලත් පෙරේරා මිය | | 2,000 |
| 14/ D-0269/0270 | චම්පා සහ සෝමලතා මිය | | 2,000 |
| 14/A-17976-17995 | ඩබ්. ජී. ප්‍රනාන්දු | 33-5123 | 2,000 |
| KETA-0614 | පරිත්‍යාග | | 2,000 |
| 14/A-17251-17275 | ජී. ඒ. එම්. සිල්වා මයා | 31-4847 | 2,500 |
| 14/A-21426-20450 | ගුරුගේ විජේරත්න මයා | 34-5339 | 2,500 |
| 14ඒ-21251-21275 | එම්.ජී.එම්.ඩී.සිල්වා මිය | 34-5338 | 2,500 |
| 14/A-21401-21425 | නුවන් තරංග මයා | 34-5238 | 2,500 |
| 14/A-20100-20125 | මධුෂානි හපුගොඩ මිය | 34-5250 | 2,500 |
| 14/A-21476-21500 | එම්.බී.වීරසිංහ | 33-5130 | 2,500 |
| 14/A-20176-20200 | විජේසූරිය මිය | 33-2511 | 2,500 |
| 14/A-21326-21350 | ලියනගේ චන්ද්‍රදාස මයා | 34-5274 | 2,500 |
| 14/A-2010-20130 | පි. එස්. නිරිඇල්ල | 34-5304 | 2,500 |
| 14/A-19076-19100 | ශාන්ති ඉලංගසිංහ මිය | 33-5207 | 2,500 |
| 14/A-17326-17350 | පුබුදු උපේක්ෂ ගුණරත්න මයා | 32-5020 | 2,500 |
| 14/A-21251-21250 | එම්. එච්. ලක්ෂ්මන් මයා | 34-5284 | 2,500 |
| 14/A-17051-17075 | රන්ජිත් මුණසිංහ මයා | 32-4920 | 2,500 |
| 14/A-9951-9975 | නුවන් පෙරේරා මයා | 31-4214 | 2,500 |
| 14/A-21551-21575 | සවිත්‍රා වික්‍රමසිංහ මයා | 20-3278 | 2,500 |
| 14/A-24501-24525 | එෆ්. වී. හාමර් මිය | 35-5509 | 2,500 |
| KETA-0570 | අරුණ පෙරේරා මයා | 06-0570 | 2,500 |
| 14/A-25551-25575 | ඩී. ආර්. ජයසිරි මයා | 34-5264 | 2,500 |
| 14/A-18276-18300 | නදීකා සංජීවනී මිය | 33-5209 | 2,500 |
| 14/A-24126-24150 | දර්ශනී පතිරණ මිය | 35-5425 | 2,500 |
| 14/A-24301-24325 | මංගලිකා අමරබන්ධු මිය | 35-5368 | 2,500 |
| 14/A-24976-25000 | පත්මා පුංචිහේවා මිය | 22-3491 | 2,500 |
| 14/A-25251-25275 | පොඩි මැණිකේ දූල්වල මිය | 35-5462 | 2,500 |
| 14/A-21226-21250 | පද්මිණී කුමාරසිරි මිය | 21-3325 | 2,500 |
| 14/A-21501-21525 | විවේකා දියගම මිය | 34-5221 | 2,500 |
| 14/A-24176-24200 | නදීකා ප්‍රියදර්ශනී මිය | 35-5463 | 2,500 |
| 14/A-24401-24425 | බාල මැණිකා මිය | 35-5399 | 2,500 |
| 14/A-25226-25250 | සෝමා සවර්නලතා මිය | 35-5379 | 2,500 |
| 14/A-21076-21100 | එන්. ජී. එච්. එරන්දි මිය | 31-4848 | 2,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-25126-25150 | පූර්න ප්‍රදීප් මයා | 35-5411 | 2,500 |
| 14/A-25276-25300 | ඩී. ආර්. ජයසිරි මයා | 34-5264 | 2,500 |
| 14/A-17726-17750 | අමිල ද සිල්වා මයා | 33-5184 | 2,500 |
| 14/A-25626-25650 | අමිල ද සිල්වා මයා | 33-5184 | 2,500 |
| 14/A-20301-20325 | එල්. පි. දයාවතී මිය | 34-5335 | 2,500 |
| 14/A-1776-1800 | ප්‍රදීප් මයා මහියංගනය | | 2,500 |
| 14/A-1751-1775 | ප්‍රදීප් මයා මහියංගනය | | 2,500 |
| 14/A-24076-24100 | එන්. ජයවීර | 35-5349 | 2,500 |
| 14/A-25101-25125 | ඩී.පි. ආර්. දුමින්ද මයා | 35-5407 | 2,500 |
| 14/A-21576-21600 | ජී. ජයවර්ධන මිය | 34-5231 | 2,500 |
| 14/A-25601-25625 | ඔ. පි. එම්. දීපිකා මිය | 23-3630 | 2,500 |
| 14/A-24376-24400 | පි. ඩී. බී. ඒකනායක | 35-5418 | 2,500 |
| 14/A-25426-25450 | සි. කේ. මුණසිංහ මිය | 35-5413 | 2,500 |
| 14/A-25526-25550 | චන්ද්‍රිකා පෙරේරා මිය | 35-5406 | 2,500 |
| 14/A-24051-24075 | ඩබ්. එස්. සිල්වා මිය | 30-4542 | 2,500 |
| 14/A-21626-21650 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 2,500 |
| 14/A-25151-25175 | අනෝජා ශ්‍යාමලී මිය | 35-5471 | 2,500 |
| 14/A-25176-25200 | එස්.චන්ද්‍රිකා මිය | 35-5470 | 2,500 |
| 548 | ප්‍රේමා උදයරත්න මිය | | 4,000 |
| 547 | ඔ. පි. එම්. දීපිකා මිය | | 4,600 |
| 14/A-23951-23999 | වසන්ති රාජපක්ෂ මිය | 34-5310 | 5,000 |
| 14/A-24851-24900 | පද්මා පුංචිහේවා මිය | 22-3491 | 5,000 |
| 14/A-20676-20725 | උදිතා ජයතිස්ස මිය සහ චන්දන ජයතිස්ස මයා | 33-5161 | 5,000 |
| 14/E-0099 | ඉන්දු මාලනි පෙරේරා මිය | 01-229 | 5,000 |
| 14/E-0100 | තිලක නන්ද පෙරේරා මයා | | 5,000 |
| 14/E-0111 | පියසෝම කෝරලේ විදාන මයා | 29-4415 | 5,000 |
| 14/A-21676-21725 | සිදර්ශනී පෙරේරා මිය | 34-5228 | 5,000 |
| 16/J-0006 | මෛත්‍රී මයා සහ බුද්ධිනි මිය | | 5,000 |
| 14/E-0112 | ඩබ්. එම්. සි. පෙරේරා මිය | 18-2952 | 5,000 |
| KETA-0439-440 | ප්‍රදීප් මයා මහියංගනය | | 5,180 |
| 546 | සුජාතා පරමානන්ද මිය | | 7,400 |
| KETA-0439-440 | ප්‍රදීප් මයා මහියංගනය | | 8,920 |
| | ප්‍රදීප් මයා මහියංගනය | | 9,650 |
| 16/J-0007 | ජී. ඒ. එස්.ගමගේ | 34-5218 | 10,000 |
| 14/F-0021 | එච්. ටී. යූ.පෙරේරා මිය | 33-5137 | 10,000 |
| 14/F-0022 | අනුලා පාඩුවාවල මිය | 13-2269 | 10,000 |
| 14/F-0023 | පත්මා පුංචිහේවා මිය | 22-3491 | 10,000 |
| 14/F-0023 | ඒ. එස්. තුෂාර මයා | 35-5513 | 10,000 |
| 14/F-0024 | එම්. සමුදු රණවැල්ල මිය | 35-5363 | 10,000 |
| KETA-0445-446 | ප්‍රදීප් මයා මහියංගනය | | 10,090 |
| 16/J-0010 | සොනල් මාර්ටින් පුතා ඇතුළු පවුලේ සැම | | 10,200 |
| 16/J-0012 | සුමනා ප්‍රේමරත්න මිය | 20-3258 | 11,000 |
| KETA-0416-0420 | ප්‍රදීප් මයා මහියංගනය | | 14,370 |
| 14/E-0126-0128 | ප්‍රදීප් මයා මහියංගනය | | 15,000 |
| | ප්‍රදීප් මයා මහියංගනය | | 15,710 |
| KETA-0437-438 | ප්‍රදීප් මයා මහියංගනය | | 16,030 |
| KETA-0416-0420 | ප්‍රදීප් මයා මහියංගනය | | 16,130 |
| KETA-0410-0415 | ප්‍රදීප් මයා මහියංගනය | | 18,080 |
| KETA-0411-0420 | ප්‍රදීප් මයා මහියංගනය | | 18,250 |
| KETA-0432-436 | ප්‍රදීප් මයා මහියංගනය | | 22,380 |
| KETA-0441-443 | ප්‍රදීප් මයා මහියංගනය | | 24,620 |
| 14/I-0010 | පි. අනුර ශාන්ත මයා | | 25,000 |
| 14/I-0011 | සෝමාවතී දහනායක මිය | 6-1114 | 25,000 |
| 14/I-0021 | නීල් වෛද්‍යසිංහ මයාට පින් පිණිස තේරංජනා කුමාරි මිද්දෙනිය මිය | 29-4430 | 25,000 |
| 14/I-0022 | ඉන්දිකා ජයකොඩි මිය | 35-5477 | 25,000 |
| 14/I-0023 | දූර්ගා කුලතුංග මිය | | 25,000 |
| 14/H-0006 | විනිතා රන්ජනී උඩුගොඩ මිය | 11-2002 | 50,000 |
| 14/H-0007 | සන්ධ්‍යා ශ්‍රී වික්‍රමාරච්චි මිය | | 50,000 |
| 14/H-0011 | එන්. ඒ. කිත්මිණී ශාන්ති මිය | 35-5465 | 50,000 |
| 14/H-0012 | තිලකා දිසානායක මිය | | 50,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. | ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 14/G-0045 | විශ්වනාත් අපොන්සු මයා | | 100,000 | 14/ G-0050 | මහින්ද රූපසිංහ මයා, | 35-5350 | 100,000 |
| 14/G-0046 | වෛද්‍ය ජගත් වරුසවිතාන මයා | 34-5310 | 100,000 | | පුෂ්පා රූපසිංහ මිය, | 35-5351 | |
| | සහ වසන්ති රාජපක්ෂ මිය | | | | ධනූෂි රූපසිංහ මෙනවිය | | |
| 14/G-0047 | සුනේත්‍රා මානෙල් පුංචිහේවා මිය | 28-4398 | 100,000 | 14/ G-0062 | පත්මා මඩවල මිය | 13-2335 | 100,000 |
| | සහ නිහාල් පුංචිහේවා මයා | 28-4397 | | 16/J-0011 | අනුලා රණවීර මිය, | 34-5322 | 101,000 |
| 14/G-0048 | පාලිකා සිරිධර්ශනී පෙරේරා මිය | 34-5228 | 100,000 | | ප්‍රියන්ති පල්ලෙවෙල මිය, | 34-5431 | |
| | සහ ලසන්ත පෙරේරා මයා | | | | කිත්මිණි රණවීර මිය | 34-5432 | |
| 14/G-0038 | වී.එස්.චන්ද්‍රසෝම මයා සහ | 26-4053 | 100,000 | 16/J-0008 | උදයංග රණවීර මයා | 28-4351 | 102,040 |
| | එම මහත්මිය | 32-4897 | | 16/J-0009 | හේලි අමා සෙනරත් මිය | 05-1039 | 111,111.11 |
| 14/G-0049 | වික්ටර් අබේසිංහ මයා, | 35-5439 | 100,000 | 16/J-0013 | දමයන්ති පෙරේරා මිය සහ | 36-555 | 121,000 |
| | ලීලා අබේසිංහ මිය, සචිනි අබේසිංහ | | | | දිමිත්‍රි පෙරේරා මිය | 36-5553 | |
| | සහ බිනාත් අබේසිංහ | | | | | | |

# 2016 වර්ෂයේ ක්‍රියාකාරී වාර්තාව අසරණ සරණ කමිටුව

මෙත්සවිය නිර්මාතෘ විසින් මෙත් සිතින් ආරම්භ කරන ලද මෙත් සවිය පදනමේ දී අසරණ සරණ කමිටුවේ 2016 වර්ෂයේදී කරන ලද සත්කාර්යන් මෙලෙස දක්වා සිටිමු.

1.) 2016 වර්ෂයේ පවත්වන ලද වාර්ෂික මහ සභා රැස්වීම් උළෙලේ දී අසරණ භාවයට පත්වූ දැයේ දරුවන්ගෙන් සුළු ප්‍රමාණයකට හෝ පිහිට වන්නට හැකිවිය.

2.) ඔවුන්ගේ ගමන් පහසුව වෙනුවෙන්, ගමන් ගාස්තු ගෙවීමේ සිට ඔවුනට අවශ්‍ය පෑන්, පැන්සල්, සී. ආර් පොත් සහ මලලසේකර ඉංග්‍රීසි ශබ්දකෝශයන් ද පරිත්‍යාග කරනු ලැබුවෙමු. ඊට අමතරව විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් කිහිප දෙනෙකුට ද අවශ්‍ය ෆයිල් කවර සහ සී. ආර් පොත් ලබා දුන්නෙමු.

3.) අගෝස්තු මාසයේ මෙත්සවිය මගින් පවත්වනු ලබන නේවාසික භාවනා වැඩසටහනේදී භාවනානුයෝගීන් වෙනුවෙන් සවස ගිලන්පස සහ දහවල් දානය පූජා කරන ලදී. ඒ සඳහා අසරණ සරණ කමිටුවේ සාමාජික මහත්ම මහත්මීන්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

4.) සැප්තම්බර් මස 8 දින පවත්වනු ලැබූ දානමය පුණ්‍යකර්මය වෙනුවෙන් ක්‍රියාකාරී සහයෝගීතාවය සහ කුරුල්ලන් නිදහස් කිරීම සිදු කරන ලදී.

අති පූජ්‍ය ආනන්ද ස්වාමීන් වහන්සේගේ පැවිදි දිවියට 75 වසරක් පිරීම නිමිති කරගෙන පවත් වනු ලැබූ පින්නවල අලි අනාථාගාරයේ දානමය පිංකමට මුදලින් ශ්‍රමයෙන් සහභාගීත්වයෙන් දායකත්වය දක්වන වන ලදි.

එලෙසම අපගේ ප්‍රධාන කර්තව්‍යය වන ශිෂ්‍යත්ව ආධාර සඳහා විශාල කැප කිරීමකින් සෙනසුරාදා හා ඉරිදා දිනයන්හිදී සිය කාලය, ශ්‍රමය සහ මුදල් වියදම් කර සභාපතිනිය ඇතුලු සාමාජිකාවන් කිහිප දෙනෙකු පැමිණ මහගු සේවාවක් අසරණ සරණ කමිටුව වෙනුවෙන් සිදු කරනු ලබයි. ඒවා නම්,

- ශිෂ්‍යත්ව ප්‍රදානිත පින්වත් මහත්ම මහත්මීන් සහ ශිෂ්‍යත්ව ලාභී දරුවන් අතර සබඳතාවය ඇතිකිරීම සඳහා
- ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන පින්වතුන්ට අදාල සිසුවාගේ ප්‍රගතිය දන්වා ප්‍රගති වාර්තාව සහිත ලිපි යැවීම.
- වාර්තා එවීම ප්‍රමාද වූ විට සිහි කැඳවීම් ලිපි යවන අතර දුර බැහැර පින්වතුන් වෙනුවෙන් සිසුවාගේ ගෙවීම් ලකුණු කිරීමට කාඩ් පත් යැවීම සිදු කරනු ලබයි.
- ශිෂ්‍යත්ව ලාභී දරුවන් වෙතින් ප්‍රගති වාර්තා සහ වියදම් වාර්තා අප වෙත ලැබීම ප්‍රමාද වන හෙයින් නොකඩවා අදාල සිසුවා වෙනුවෙන් එම වාර්තා එවන ලෙස දන්වා ලිපි යැවීම.
- දෙමාපියන් නොමැති විට භාරකාරත්වය පිළිබඳ ගැටලු ඇතිවී ඇති බැවින්, භාරකාරත්වය අප වෙත තහවුරු වන ලෙස නිසි අයුරින් සිදුවිය යුතු බව දන්වා ලිපි යැවීම සහ බැංකු ගිණුම් සහ ගිණුම් අංක ගැටළු ඇති නොවන ලෙස අප වෙත යොමුකරන ලෙස දැනුවත් කිරීමට ලිපි යැවීම.

## ගිණුම් කටයුතු වලට අදාල ක්‍රියාකාරකම්

- ශිෂ්‍යත්ව ප්‍රදානිත පින්වතුන් විසින් එවනු ලබන මුදල් මාසිකව ලදුපත් ඇසුරින් නිසිලෙස ලෙජරගත කිරීම. (අදාල සිසුවාගේ ශිෂ්‍යත්ව මුදල් බැරකිරීම )
- ශිෂ්‍යත්ව 60ක සිසුන්ට මුදල් යැවීම සඳහා අදාල ගිණුම් වල අංක වලට වවුචරපත් ලිවීම සහ ඒවා අදාල ගිණුම් වලට නිවැරදිව බැරවී ඇත්දැයි පරීක්ෂා කිරීම.
- බැංකුවට මුදල් තැන්පත් කිරීමෙන් පසු වවුචර පිටපත් අදාල සිසුවන්ගේ ෆයිල් වලට අනුගත කර විනිවිද භාවයෙන් යුතුව සිදු කිරීම.
- 60කට ආසන්න සිසුන්ගේ ගිණුම් වලට මුදල් බැර කිරීම සඳහා සිසු නාමලේඛන සකසා පරිඝනක ගත කර, පරිඝනක වාර්තාව සභාපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු චෙක්පත ලිවීමට කටයුතු කිරීම සහ එම මුදල් සිසුන්ගේ ගිණුම් වලට බැර කිරීම සිදු කරනු ලබයි.

## ලිපිගොනු සම්බන්ධ ක්‍රියාකාරකම්

- 60කට ආසන්න ශිෂ්‍යත්ව ලාභීන් සඳහා වෙන් වෙන්ව යොමු අංක ලබාදී ඇති අතර ඒ සෑම යොමු අංකයක් සඳහාම ලිපි ගොනුවක් විනිවිද භාවයෙන් යුතුව පිලියෙල කර ඇත.
- මීට අමතරව සෑම සිසුවකුට සහ අදාල දානපතියා හට ලෙජර පත්‍රයක් වෙන් කර ඇති අතර ඒ අනුව ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා ලෙජර පොත් දෙකක් දැනට භාවිතයේ පවතී.

අවශ්‍ය විටෙක අවශ්‍ය ඕනෑම ගණුදෙනුවක් මෙම ලෙජරයෙන් විනිවිද භාවයෙන් යුතුව සොයා ගත හැකි අතර, ලිපි ගොනුවෙන් දානපතියාගේ සහ සිසුවාගේ පුද්ගලික තොරතුරු ලබාගතහැකි අයුරින් අසරණ සරණ කමිටුව සිය කාර්ය භාරය සිදු කරනු ලබයි.

# සිත් තුළින් පිදුම් ලත් වදන්



## චන්ද්‍රා මහ ඇදුරුතුමනි

පුළුල් දැනුමෙන් ගෝල පිරිසගෙ මනස සුවපත් කරන නන්දන
නිමල් ඔබ "රන් ජය" වැඹකි, අප හද තුළට යහගුණය කැන්දන
කුසල් බලයෙන් දැනුම දෙන ඔබ නිවන් දොර වෙත අපව කැන්දන
විසල් රුක් ගොමු අතර සිටිනා මහ රුකකි ගුරු දේව චන්දන

හසර නොම දැන සසර තකරේ ගිනි ගොඩක සිට දැවෙන අප වැනි
අතර මං වුණ අයට නිතරම පිහිට වන ඔබ මහැදුරාණනි
සසර බව දුක දුරු කරන්නනට අපව සැමවිට දෙන ඔවා මිණි
සතර සම්පත්තිය ද ලබමින් දිගු කලන් වැජඹෙනු පියාණනි

මෙත් සවිය සාමාජිකා - එච්. ඒ. සෝමලතා 34/5296

---

ජී. චන්ද්‍රා සඳුකුමාරි පෙරේරා (සීය)
ජේ. ජයන්ත ද්‍රව්‍යා සමාජ (බුල)
අංක: 25/C
උද්‍යාන පාර
රත්මලාන
2016 - 10 - 18

මෙත් සවිය ශ්‍රී විහාරාරාමය
පෙඩ්‍රිස් පාර,
බැල්ලවත්ත
කොළඹ - 06

ඔබ තුමන් ල ලබාදෙන ශිෂ්‍යාධාරය, මගේ දියණියගේ ඉංග්‍රීසි පන්තියක ගාස්තු ගෙවන්න බොහෝසෙයින් උදව් කරයි.
මෙම උපකාරය ගැන සාමාජික සාමාජිකයින් ඇතුළු ඔබ සැමට පිං සිද්ධ වේවා!

මගේ දියණිය ... ලබා ... ලබාදෙන ... සාමාජිකයන් ... ද්‍රව්‍යවලට පිහිට ... පිං පතමි.

මීට
දියණියගේ පියා
චන්ද්‍ර

---

ජී. දුලාර් ... 
22, මැවිකාරාම පාර,
මාද්දුව
26.11.2016

ලේකම්,
අසරණ සරණ සමිතිය,
මෙත් සවිය ශ්‍රී විහාරාරාමය,
පෙඩ්‍රිස් පාර,
කොළඹ 06.
ගරු මහත්මයාණනි,

මෙත් සවිය ශිෂ්‍යාධාරය සම්බන්ධයෙනි

ඉහත නාම සඳහන් මා දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දෙවන වසර වෛද්‍ය ශිෂ්‍යාවක් වන අතර පසුගිය වසරේ එනම් 2015 වර්ෂයේ මාගේ මව හා පියා යන දෙදෙනාම මිය යාමෙන් අනතුරුව ආදායම් මාර්ගයක් නොමැතිවීම හේතුවෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනයට අත්වැලක් ලෙස ඔබ පදනම යටතේ ශිෂ්‍යාධාරයක් ඉතා ස්තුතිපූර්වකව ලබාගත්තෙමි.

නමුත් මෙම වසරේ අගෝස්තු මස සිට මාගේ පියාගේ වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මා හට ලබාදීමට කටයුතු කර ඇතිබැවින් මෙතෙක් කල් මා හට ලබා දුන් ශිෂ්‍යාධාරය අවලංගු කොට මා වෙනුවට අසරණ තත්වයකට පත්ව ඇති වෙනත් කෙනෙකු හට උපකාරයක් ලෙස ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි.

තවද මෙතෙක් කල් මාගේ අධ්‍යාපනය වෙනුවෙන් ඔබ පදනමෙන් ලබා දුන් මහඟු සහයෝගයට නැවත වතාවක් ඉතා කෘතඥ වෙමි.

03 DEC 2016
මෙත් සවිය
6 විහාරාරාම පෙඩ්‍රිස් පාර
කොළඹ - 06

මෙයට විශ්වාසී,
(අත්සන)

---

මෙත් සවිය
6 විහාරාරාම පෙඩ්‍රිස් පාර
කොළඹ - 06
20 JAN 2017

2017-01-17
පාලිකා දිල්හරා ...
මහවලවත්ත,
තවලම දිවුල
තවලම

විශේෂ ආධාර පිරිනමන මණ්ඩලය වෙත.

ඔබ ආයතනය මගින් මට ශිෂ්‍යත්වය ගැන ඉතාම සතුටුවෙමි. ඒ වගේම ඔබ ආයතනයට බොහෝම ස්තුතිවන්ත වෙමි.

මෙම ශිෂ්‍ය ආධාරය මා හට ලැබීම නිසා මගේ අධ්‍යාපන කටයුතු හොඳින් කර ගැනීමට පුළුවන්. මම ඉතාම ප්‍රසාදයෙන් බැඳී සිටිමි. මට ශිෂ්‍ය ආධාර පිරිනමන ඔබ ආයතනයට ඉදිරියටත් පින් ලැබේවා. මම ඔබට ස්තුති වන්නෙමි. ඔබ ආයතනයේ මුදල් අපතේ නොයවා හොඳින් ඉගෙන ගනිමි.

ඔබ සැමටම නිරෝගීමත් සුව දිගාසිරි පතමි. ප්‍රාර්ථනා.

මෙයට
දිල්හරා සිතුමිණ.

# මෙත් සවිය අසරණ සරණ ශිෂ්‍යත්ව ලාභීන් සහ ප්‍රදානය කළ සුපින්වතුන්

| ශිෂ්‍යත්ව ලාභියාගේ නම | පාසල | ශිෂ්‍යත්ව ප්‍රධානියාගේ නම | මුදල |
|---|---|---|---|
| 1 පූජ්‍ය දෙමටවැවේ සුසීම හිමි | ශ්‍රී සද්ධානන්ද මූලික පිරිවෙන, මරදන්කඩවල | චින්තක බණ්ඩාර මහතා | 1000/- |
| 2 පූජ්‍ය කොහොඹගස්කඩ නාලක හිමි | ශ්‍රී විද්‍යාධාර මහා පිරිවෙන අනුරාධපුර | චමින්ද වෙදගේ මහතා | 1000/- |
| 3 පූජ්‍ය වත්තේවැවේ සුභූති හිමි | ශ්‍රී සද්ධානන්ද මූලික පිරිවෙන මරදන්කඩවල | 1.) ශානිකා සමරවික්‍රම මහත්මිය (2014.10.14. - 2015.12.15.දක්වා)<br>2.) මිහිලා උදයංගනී මහත්මිය | 1000/-<br>1000/- |
| 4 කවීජා කෞශල්‍යා | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය දොම්පෙ | 1.) අජිත් ප්‍රනාන්දු මහතා (2014.9 - 2015.12 දක්වා)<br>2.) දීපිකා ගුණවර්ධන මහත්මිය (2016 ඔක්තෝබර් සිට) | 500/-<br>1000/- |
| 5 වරුණ රුක්ෂාන් ඒකනායක | බතලයාය මහා විද්‍යාලය, අලුත්තරම මහියංගනය | 1.) දෙනුෂි ප්‍රනාන්දු මෙනවිය<br>2.) එම්. ඩබ්. මාලනී වීරසිංහ මිය | 500/-<br>750/- |
| 6 අසංක සෙනවිරත්න | පහල කුඩාපට්ටිය මහ විදුහල, කහටගස්දිගිලිය | 1) ජේ. ඇම්. ඩී. ටී. පියුශාන් මහතා (2014. 09 සිට 2015. 08 දක්වා)<br>2) තරංගා විජේසිංහ මහත්මිය (2015.09 සිට ) | 1000/-<br>1000/- |
| 7 චතුර මධුරංග දිසානයක | පහල කුඩාපට්ටිය මහ විදුහල, කහටගස්දිගිලිය | 1) ජේ. ඇම්. ඩී. ටී. පියුශාන් මහතා (2014. 10 සිට 2015. 8 දක්වා)<br>2) ජේ. ඒ. දයාවතී මිය. (2015. 10 සිට ) | 1000/-<br>1000/- |
| 8 අචින්ත අබේසිංහ | කහටගස්දිගිලිය මධ්‍ය විද්‍යාලය, කහටගස්දිගිලිය | තරංගා මංචනායක (2016. 10 දක්වා) | 1000/- |
| 9 ශශින් අභිෂේක් | ශාන්ත ජෝසප් විද්‍යාලය, කොළඹ 10 | 1) නාලිනි ජයලත් පෙරේරා මිය (2014. 9 සිට 2015. 7 දක්වා)<br>2) සුරංග කුමාර (2015. 8 සිට) | 1000/-<br>1000/- |
| 10 පබසරා සෙව්වන්දි | පහල කුඩාපට්ටිය මහ විදුහල, කහටග්සදිගිලිය | 1) ජේ. ඇම්. ඩී. ටී. පියුශාන් මහතා (2014. 7 සිට 2015. 7 දක්වා)<br>2) සෞම්‍ය ධර්මරත්න මහතා (2015. 8 සිට ) | 1000/- |
| 11 ගිෂාන් මධුශංක | ශාන්ත ජෝන් ජාතික විද්‍යාලය , පානදුර | සමන්තා නිලංගනී මිය | 1000/- |
| 12 කේ. සත්සරණ ජෝසප් | ශ්‍රී ගුණානන්ද විදුහල, කොටහේන | 1.) ඉන්දික මහානාම ධර්මවර්ධන මහතා<br>2.) ටී. ජී. දුලන්ති වජිර කුමාරි මිය | 500/- |
| 13 සනුක බණ්ඩාර ගුණතිලක | මිරිස්වත්ත ජාතික පාසැල, දොඩම්ගොඩ | හර්ෂ වීරසූරිය මහවිදානගේ මයා | 1000/- |
| 14 ලක්මාල් පීරිස් සමරසිංහ සිරිවර්ධන | හොරණ විද්‍යාරත්න පිරිවෙන | ඩී.එච්.ජී.කේ. එදිරිසිංහ මයා | 1000/- |
| 15 එච්. ඒ. සී. නිමේෂිකා හපුආරච්චි | ආචාර්ය එන්.එම්.පෙරේරා මධ්‍ය මහා විද්‍යාලය, යටියන්තොට | අසංක කෝසල එදිරිසිංහ මයා | 1000/- |
| 16 ජේ. ඒ. දිලංකා රණවීර | වේයන්ගොඩ ප්‍රාථමික විදුහල, වේයන්ගොඩ | අමිල ලක්ෂිත පෙරේරා මයා | 1000/- |
| 17 කේ. ඉෂිනි සඳලිකා | කහටාන කනිෂ්ඨ විදුහල, හේනේගම, වැලිවේරිය | රවී සමරනායක ( මාස 4 ක් )<br>පර්සි අබේරත්න ( මාස 3 ක් ) | 500/- |
| 18 | | චාන්දනී දේවිකා වීරසේකර | 1000/- |
| 19 කේ. අශේන් මයන්ත | දූනගහ රණසිංහ මහා විද්‍යාලය, දූනගහ, මරදගහමුල | ඊ. ඒ. පී. මහේශිකා දේවසුරේන්ද්‍ර මිය | 1000/- |
| 20 ඉෂාරා තරංගනී පුංචිහේවා | අළුත්වැව කණිෂ්ට විද්‍යාලය, හම්බේගමුව, තණමල්විල | අමා සමරධීර මිය | 1000/- |
| 21 කේ. ඒ. හෂාන් අනුර ශාන්ත | සිරිධම්ම විදුහල, ලබුදූව, ගාල්ල | නිහාල් ප්‍රනාන්දු මයා<br>දයාශාන්ති එල්.පී. මිය | 600/- |

| ශිෂ්‍යත්ව ලාභියාගේ නම | | පාසල | ශිෂ්‍යත්ව ප්‍රධානියාගේ නම | මුදල |
|---|---|---|---|---|
| 22 | බී. එච්. කවිෂා සඳරුවනි | හල්ලල මහ විදුහල, වැලිගම | පූජ්‍ය ගලගෙදර සුනන්දා සිල් මෑණියෝ වෙනුවෙන් ඇසල විජේරත්න මයා | 1000/- |
| 23 | ඒ. එම්. ඉමල්කා මදුෂානි | ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලය , අවිස්සාවේල්ල | නාලනී ජයලත් පෙරේරා මිය | 1000/- |
| 24 | තරුෂ චරිත් ඉද්දගොඩ | කයිකාවල ශ්‍රී රේවත විදුහල, ඉඳුරුව | චමින්ද ඉන්දික මයා | 1000/- |
| 25 | ජනිත් පසිඳු ඉද්දගොඩ | ගෝනගල මහා විද්‍යාලය, ගෝනගලපුර | චිත්‍රානන්ද පී. ලියනගේ මයා | 1000/- |
| 26 | පී. පියුමි හර්ෂිකා මධුවන්ති | නාගපොකුණ විදුහල, ජයන්තිපුර, හිඟුරක්ගොඩ | දර්ශන ප්‍රදීප් ආරියදාස මයා<br>2015. 5 සිට 2015. 8 දක්වා | 1000/- |
| | | | ගයාන් ලසන්ත පෙරේරා මයා<br>2016. 10 සිට | 1000/- |
| 27 | තරුෂි දිව්‍යාංජලී විතාන | මහගමසේකර මහ විදුහල රදාවාන | 1.) එච්.ඒ.එස්. සුසිල් කුමාර මයා | 1000/- |
| | | | 2.) සී. හසිත කුලවර්ධන | 1000/- |
| 28 | නෙදුර සුපුන් සචිරංග | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය,දොම්පේ | එම්. කේ. රවිරු රන්කෙත් පුතණුවන් | 500/- |
| 29 | ඉෂිනි නවෝද්‍යා වීරක්කොඩි | වෑවිට මෛත්‍රී මහා විදුහල, බණ්ඩාරගම | ධම්මිකා ජයවර්ධන මිය | 1000/- |
| 30 | ඒ. නෙත්මි අහින්සා සමාධි පෙරේරා | උසස් බාලිකා විදුහල, ගල්කිස්ස | ඔනාඩි සුපෙත්මා සමරධීර දියණිය | 1000/- |
| 31 | කේ. ඒ. ඉරෝෂ් කාවින්ද පෙරේරා | ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විදුහල, මහරගම | හිමාලි කැළණියගේ මිය | 1000/- |
| 32 | ඩබ්. වී. ලක්ෂාන් හර්ෂණ වනසිංහ | වේයන්ගොඩ ප්‍රාථමික විදුහල, වේයන්ගොඩ | සුගතදාස සමරධීර මයා | 500/- |
| 33 | එම්. වයි. දම්හිරු පීරිස් මලලනායක | තන්තිරිමුල්ල ප්‍රාථමික විදුහල, පානදුර | ඩබ්.සී. කොඩිතුවක්කු මිය | 500/- |
| 34 | එම්. වයි. කවීශා පීරිස් මලලනායක | ශාන්ත ජෝන් විදුහල, පානදුර | ඩබ්.සී. කොඩිතුවක්කු මිය | 500/- |
| 35 | ඩී. ඩබ්. පී. නුවණි ධරණිකා | ධර්මවික්‍රම බාලිකා විදුහල , නුවර | හර්ෂ ජයවීර මයා | 1000/- |
| 36 | වයි. එම්. රමේෂ් ලක්ෂාන් | බතලයාය මහා විද්‍යාලය, අළුත්තරම, මහියංගනය | එම්.එල්. සුනේත්‍රා මිය | 500/- |
| 37 | කේ. පී. එන්. සෙව්වන්දි අල්විස් | සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය, කොළඹ 7 | ඩී. රමණි කුරුප්පු මිය | 1000/- |
| 38 | ඩබ්. එම්. දිල්හානි තරුෂිකා | වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය, වැලිමඩ | සුදර්ශි ගුණසේකර මිය | 1000/- |
| 39 | එස්. දිලන දම්යුග | බෞද්ධාලෝක මහා විද්‍යාලය,වෑකඩ, පානදුර | බී. පසන් ගාමිණ්ද මයා | 750/- |
| 40 | කේ. සචින් විශ්ව රාජපක්ෂ | වාද්දුව මධ්‍ය ප්‍රාථමික විද්‍යාලය, වාද්දුව | බී. විමලසේන මයා | 750/- |
| 41 | එච්. එම්. සෙනෙරි | හල්ලල මහා විද්‍යාලය වැලිගම | සන්ධ්‍යා ජයතුංග මිය | 500/- |
| 42 | නෙත්මි දිල්සරා අබේසිංහ | සිරිධම්ම විද්‍යාලය ගාල්ල | ඩබ්. ටී. ඩිලන්ත අනුෂ කුමාර මයා | 1000/- |
| 43 | අහින්සා සෙව්මිණි රත්නායක | පිඹුරුවැල්ලේගම මධ්‍ය මහා විද්‍යාලය, කුරුණෑගල | ජේ. එස්. දිනූකා මිය | 1000/- |
| 44 | එන්. කේ. හන්සනා මෙත්තානි නානායක්කාර | සිරිධම්ම විද්‍යාලය, ගාල්ල | වී. එස්. දිනිති මන්සලා මිය | 1000/- |
| 45 | ආර්. එම්. නදීකා ප්‍රියදර්ශනී රත්නායක | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වෛද්‍ය පීඨය | සදිත් කැලණියගේ මයා. | 2000/- |
| 46 | කේ. හචිනි මල්කුමරි | එස්. මහින්ද මහා විද්‍යාලය, අළුබෝමුල්ල, පානදුර | පුෂ්පා ජයන්ති පෙරේරා මිය | 1000/- |
| 47 | එස්. ඒ. සසංක සත්සර ප්‍රනාන්දු | ශාන්ත අන්තෝනි විදුහල, පානදුර | ඩී. උදාරි එදිරිසූරිය මිය | 1000/- |
| 48 | එම්. ඩී. දිලුක් ශානක විසාද් | ශ්‍රී ලංකා තාක්ෂන විද්‍යාලය, කොලඹ 10 | ස්වර්ණා ගුණසේකර මිය | 1000/- |
| 49 | ආර්. ඒ. ඩී. කවිෂ්ක සහන් | විද්‍යාලෝක මහා විද්‍යාලය , ඇරැව්වල, පන්නිපිටිය | ඩබ්. ඒ. ඒ. ශීලා චන්ද්‍රසෝම මිය | 500/- |
| 50 | ඩී. ඩී. රසාංජන කුමාර | ඥානෝදය මධ්‍ය මහා විද්‍යාලය, වාරියපොල | අතුල නානායක්කාර මයා | 1000/- |
| 51 | ඩබ්. එම්. ඒ. දුල්ෂානි විජේසිංහ | කුරුණවා කනිටු විදුහල, වාරියපොල | අතුල නානායක්කාර මයා | 1000/- |
| 52 | ඒ. ඒ. එම්. චතුරංග ප්‍රියෂාන් | ශ්‍රී ධර්මාලෝක මධ්‍ය මහ විද්‍යාලය, දොම්පෙ | ඩී. එස්. හේමා ගීගන | 1000/- |

# මෙත් සවිය මේ දක්වා ගෙවා නිමකළ ශිෂ්‍යත්ව

| | ශිෂ්‍යත්ව ලාභියාගේ නම | පාසල | ශිෂ්‍යත්ව ප්‍රධානියාගේ නම | මුදල | ශිෂ්‍යත්වය නතර කිරීමට හේතුව |
|---|---|---|---|---|---|
| 1 | දිල්නා පෝපිනී ආටිගල | විශාකා විද්‍යාලය | මහාචාර්ය චන්දන ජයරත්න මහතා | 1000/- | පියාට ගැවත රැකියාවක් ලැබීම |
| 2 | පූජ්‍ය ඉහලහල්මිල්ල වැවේ ඥානරතන හිමි | ශ්‍රී භාරතී විද්‍යායතන පිරිවෙන, පේරාදෙණිය | මංජුල පද්ම කුමාර රණසිංහ මහතා | 1000/- | පිරිවෙන් අධ්‍යාපනය නිමා කර ඇත |
| 3 | පූජ්‍ය අම්බලන්ගොඩ සිරිරතන හිමි | සිරි සුමන්ගල ධර්මායතන පිරිවෙන අනුරාධපුර | මිහිලා උදයන්ගනී මහත්මිය | 1000/- | පිරිවෙන් අධ්‍යාපනය නිමා කිරීම |
| 4 | අමාලි චතුරිකා විජේසූරිය | රජයේ විද්‍යා විද්‍යාලය, මාතලේ | තරංගා විජේසිංහ | 1000/- | උසස් පෙළ නිමාවී ඇත |
| 5 | ප්‍රමෝද් චතුරංග සෙන්දනායක | තක්ෂිලා මධ්‍ය විද්‍යාලය, හොරණ | ජේ. ඒ. දයාවතී මිය. | 1000/- | ප්‍රගති වාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 6 | තරිඳු සෙන්දනායක | තක්ෂිලා මධ්‍ය විද්‍යාලය, හොරණ | චම්පිකා සිරිබද්දන මිය. | 1000/- | ප්‍රගති වාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 7 | කසුන් තිලකරත්න | නිවන්තක චේතිය මහා විද්‍යාලය, අනුරාධපුර | තරංගා මංචනායක | 1000/- | උසස් පෙළ නිමා කර ඇත |
| 8 | ලහිරු දිල්හාර | ශාන්ත ජෝන් මහා විද්‍යාලය, පානදුර | එස්. එම්. වික්‍රමසිංහ | 1000/- | උසස් පෙළ නිමා කර ඇත |
| 9 | ප්‍රිතිකා දමයන්ති | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය කළමණාකරණ පීඨය | එච්. පී. කේ. එදිරිසිංහ මහතා | 1000/- | විශ්ව විද්‍යාල අධ්‍යාපනය නිමා කර ඇත. |
| 10 | දිනිති මහේෂිකා | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය, දොම්පෙ | සමන්තා නිලංගනී මිය | 1000/- | ප්‍රගති වාර්තා සහ ගිණුම් වාර්තා අදාළ කාළ සීමාවට එවා නැත. |
| 11 | අවිශ්ක ප්‍රසාද් ජයසුන්දර | මහානාම මහා විද්‍යාලය, මොණරාගල | බුද්ධික ජයවීර මහතා සහ බිනරි ගමගේ මහත්මිය | 1000/- | ප්‍රගති වාර්තා නොමැති නිසා |
| 12 | චරිත් ප්‍රසංග ගමගේ | ශ්‍රීපාලි විද්‍යාලය හොරණ | සෞම්‍ය ධර්මරත්න මයා | 1000/- | උසස් පෙළ නිමා කර ඇත. |
| 13 | කේ. ඒ. තරණි රසාංජලී | උසස් බාලිකා විදුහල, ගල්කිස්ස | ස්වර්ණා ගුණසේකර මිය | 600/- | ප්‍රගතිවාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 14 | පූජ්‍ය මහවැවේ රතනධම්ම හිමි | ජයමග මහ පිරිවෙන හිගුරක්ගොඩ | 1.) පී. ආර්. හේරත් මිය 2015. 5 සිට 2015. 8 දක්වා 2.) චාන්දනී දේවිකා වීරසේකර මිය | 1000/- | ප්‍රගති වාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 15 | පූජ්‍ය උණගලාවෙහෙර කුසලධම්ම හිමි | ජයමග මහ පිරිවෙන, හිගුරක්ගොඩ | නිලංක දිවාසන මයා | 1000/- | ප්‍රගති වාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 16 | ටී. කේ. රවිඳු සඳරුවන් | ආනන්ද විදුහල කොළඹ 10 | චාන්දනී දේවිකා වීරසේකර මිය 2015. 8 සිට 2016 . 1 දක්වා | 1000/- | පියාගේ කාර්යාලයෙන් ශිෂ්‍යත්වයක් ලබා දෙන බැවින් ඔහුගේ ඉල්ලීම පරිදි එම මුදල වෙනත් ශිෂ්‍යත්ව ලාභියකුට ප්‍රදානය කරන ලදී. |
| 17 | පී. ඒ. රසාංගි ලක්ෂිකා නෙත්සරණි | ඉන්දොලමුල්ල කනිෂ්ඨ විද්‍යාලය, දොම්පේ. | එම්. කේ. රිස්නි පියත්මා සෙනලි දියණිය | 500/- | ප්‍රගති වාර්තා නොමැති නිසා ශිෂ්‍යත්වය තාවකාලිකව නවතා ඇත. |
| 18 | සීක්කු ආරච්චිගේ දුලාරි පබසරා | විශ්ව විද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර, වෛද්‍ය පීඨය | හිමාලි කැළණියගේ මිය | 2000/- | පියාගේ වැන්දුමු හා අනන්දරු විශ්‍රාම වැටුප ලැබෙන නිසා එම මුදල් වෙනත් දරුවකුට ප්‍රධානය කරනු ලැබේ. |

# මෙත් සවිය ශිෂ්‍යත්වය

## ඔබ ශිෂ්‍යත්වයක් බලාපොරොත්තුවෙන් සිටින අයෙක් ද?





## ඔබ ශිෂ්‍යත්වයක් පරිත්‍යාග කිරීමට කැමති අයෙක් ද?

## කරුණාකර මෙත් සවිය කාර්යයාලය අමතන්න...

MKJ ASSOCIATES
*Chartered Accountants*
*Accounts & Tax Consultants, Company Secretaries.*

**TO THE DIRECTORS OF METH SAVIYA MANASA ADYAPANA SANWARDANA MAITHREE SANSADAYA**

**Report on the Financial Statements**

We have audited the accompanying financial statements of Meth Saviya Manasa Sanwardana Maithree Sansadaya (Meth Saviya) and the financial statements of the Meth Saviya which comprise the statement of financial position as at 31st December 2016, the statement of comprehensive income for the year then ended and notes comprising a summary of significant accounting policies and other explanatory information of the accounts.

**Management's Responsibility for the Financial Statements**

Management is responsible for the preparation and fair presentation of these financial statements in accordance with Sri Lanka Accounting Standards. This responsibility includes: designing, implementing and maintaining internal control relevant to the preparation and fair presentation of financial statements that are free from material misstatement, whether due to fraud or error; selecting and applying appropriate accounting policies; and making accounting estimates that are reasonable in the circumstances.

**Scope of Audit and Basis of Opinion**

Our responsibility is to express an opinion on these financial statements based on our audit. We conducted our audit in accordance with Sri Lanka Auditing Standards. Those standards require that we plan and perform the audit to obtain reasonable assurance whether the financial statements are free from material misstatement.

An audit includes examining, on a test basis, evidence supporting the amounts and disclosures in the financial statements. An audit also includes assessing the accounting policies used and significant estimates made by management, as well as evaluating the overall financial statement presentation.

We have obtained all the information and explanations which to the best of our knowledge and belief were necessary for the purpose of our audit. We therefore believe that our audit provides a reasonable basis for our opinion.

**Opinion**

In our opinion, so far as appears from our examination, the Meth Saviya maintained proper accounting records for the year ended 31st December 2016, and the financial statements give a true and fair view of the financial position of the Meth Saviya as at 31st December 2016 and it's financial performance for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

**Report on Other Legal and Regulatory Requirements**

These financial statements also comply with the requirements of Section 151(2) of the Companies Act No. 07 of 2007.

**CHARTERED ACCOUNTANTS**
07th March 2017
Colombo

MKJ ASSOCIATES Chartered Accountants

M.J. Kankanamalage. FCA , B.Com.(Sp.) , ACMA , SAT , ACEA-UK | No. 95 , Nawala Road , Nugegoda, 10250
Tel. 0112827044 / 0773760424
e-mail : associates.mkj@gmail.com

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

## STATEMENT OF FINANCIAL POSITION

As at 31st December 2016

| | Note | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Non-Current Assets** | | | |
| Property, Plant and Equipment | 7 | 142,207 | 127,666 |
| | | **142,207** | **127,666** |
| **Current Assets** | | | |
| Fixed Term Deposits | | - | - |
| Prepayments | | 17,136 | 17,136 |
| Cash and Bank Balances | 8 | 8,997,747 | 9,493,524 |
| | | **9,014,883** | **9,510,660** |
| **Total Assets** | | **9,157,090** | **9,638,326** |
| **EQUITY AND LIABILITIES** | | | |
| **Equity Attributable to Equity Holders** | | | |
| Accumulated Fund | | (64,742) | 84,045 |
| **Total Equity** | | **(64,742)** | **84,045** |
| **Non-Current Liabilities** | | | |
| Asarana Sarana Aramudala | 9 | 211,532 | 122,769 |
| Sri Sambuddhathwa Jayanthi Budhu Pilima Aramudala | 10 | 8,822,319 | 9,092,722 |
| Meth Shishyathwa Aramudala | 11 | (63,250) | (52,750) |
| Niwasa Aramudala | 12 | 12,000 | 12,000 |
| Sathun Nidaskirime Aramudala | 13 | 36,190 | - |
| | | **9,018,791** | **9,174,741** |
| **Current Liabilities** | | | |
| Membership Fees Received in Advance | | - | 186,500 |
| Accrued Expenses and Other Payables | 14 | 203,040 | 193,040 |
| | | **203,040** | **379,540** |
| **Total Equity and Liabilities** | | **9,157,090** | **9,638,326** |

These Financial Statements are in compliance with the requirements of the Companies Act No: 07 of 2007.

The accounting policies and notes form an integral part of these Financial Statements.

March 2017
Colombo

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

## CASH FLOW STATEMENT

Year ended 31st December 2016

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| **Cash Flows From / (Used in) Operating Activities** | | |
| Excess/ (Deficit) before Tax | (342,477) | (255,358) |
| Adjustments for | | |
| Depreciation | 80,566 | 65,847 |
| Interest Income | - | - |
| **Operating Profit/(Loss) before Working Capital Changes** | **(261,911)** | **(189,511)** |
| (Increase)/ Decrease in Fixed Deposits | - | - |
| Increase/ (Decrease) in Trade and Other Payables | (176,500) | 35,000 |
| Increase/ (Decrease) in Asarana Sarana Aramudala | 88,763 | 80,640 |
| Increase/ (Decrease) in Budhu Pilima Aramudala | (271,439) | 3,225,558 |
| Increase/ (Decrease) in Meth Shishyathwa Aramudala | 186,500 | (73,150) |
| Increase/ (Decrease) in Niwasa Aramudala | - | - |
| Increase/ (Decrease) in Sathun Nidahaskireeme Aramudala | (36,190) | - |
| **Cash Generated from Operations** | **(470,777)** | **3,078,537** |
| Finance Cost Paid | - | - |
| Tax Paid | - | - |
| **Net Cash from Operating Activities** | **(470,777)** | **3,078,537** |
| **Cash Flows from / (used in) Investing Activities** | | |
| Acquisition of Property, Plant and Equipment | (25,000) | (25,000) |
| Interest Received | - | - |
| **Net Cash Flows used in Investing Activities** | **(25,000)** | **(25,000)** |
| **Cash Flows from / (used in) Financing Activities** | - | - |
| **Net Cash Flows used in Financing Activities** | - | - |
| **Net Increase in Cash and Cash Equivalents** | (495,777) | 3,053,537 |
| **Cash and Cash Equivalents at the beginning of the year** | 9,493,524 | 6,439,987 |
| **Cash and Cash Equivalents at the end of the year** | **8,997,746** | **9,493,524** |

The accounting policies and notes form an integral part of these Financial Statements.

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

## STATEMENT OF INCOME AND EXPENDITURE AND ACCUMULATED FUND

Year ended 31st December 2016

| | Note | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|---|
| **Income** | | | |
| Registration Fees and Annual Membership Fees | 3 | 1,483,000 | 1,095,000 |
| Donations | | 13,500 | 105,846 |
| Other Income | 4 | - | - |
| **Total Income** | | **1,496,500** | **1,200,846** |
| **Expenditure** | | | |
| Administrative Expenses | 5 | 1,813,227 | 1,422,204 |
| Other Expenses | 6 | 25,750 | 34,000 |
| **Total Expenditure** | | **1,838,977** | **1,456,204** |
| **Surplus/ (Deficit) before Taxation** | | (342,477) | (255,358) |
| Income Tax Expense | | - | - |
| **Surplus/ (Deficit) after Taxation** | | **(342,477)** | **(255,358)** |
| **Accumulated Fund at the beginning of the year** | | **277,735** | **339,403** |
| **Accumulated Fund at the end of the year** | | **(64,742)** | **84,045** |

**විගණකවරුන් විසින් අත්සන් කරන ලද**
**සම්පූර්ණ ගිණුම් වාර්තාව**
**අවශ්‍යය නම්**
**සාමාජිකයින්ගේ අධීක්ෂණය සඳහා**
**මෙත්සවිය කාර්යාලයේ තබා ඇත.**

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

## NOTES TO THE FINANCIAL STATEMENTS

Year ended 31st December 2016

### 3. INCOME

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Registration Fees and Membership Fees | 1,483,000 | 1,095,000 |
| | **1,483,000** | **1,095,000** |

### 4. OTHER INCOME

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Interest Income from Fixed Deposits | - | - |
| | - | - |

### 5. ADMINISTRATIVE EXPENSES

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Administration Officer's Wages | 284,000 | 240,000 |
| Office Maintenance | 25,623 | 41,248 |
| Stationery Expenses | 180,630 | 79,199 |
| Transport Expenses | 14,970 | 10,850 |
| Maintenance of Office Equipments | - | 40,200 |
| Printing Expenses | - | 391,235 |
| Meditation Classs Management Fees | - | 80,000 |
| Communication Expenses | - | 30,631 |
| Stamp and Postage | 132,310 | 198,210 |
| Depreciation | 80,567 | 65,847 |
| Anniversary Expenses | 152,062 | 78,690 |
| Audit fees | 20,000 | 10,000 |
| Rent | 80,000 | 80,000 |
| Bank Charges | 1,100 | - |
| Electricity Exp | 67,982 | 49,930.97 |
| Miseleneious Exp | - | 5,700.00 |
| Secretarial fees | - | 850.00 |
| Registration Chg | 16,100 | 19,613.00 |
| Telephone | 25,503 | - |
| EMS Service Charges | 98,848 | - |
| Metsaviya Calendars | 184,000 | - |
| Leadership Programme Expense | 50,000 | - |
| Member ID Card | 56,590 | - |
| Methsaviya Magazine | 143,000 | - |
| Funeral Donation | 15,000 | - |
| Metsaviya Meditation Programme | 27,514 | - |
| Other Administration Expenses | 147,429 | - |
| | **1,803,227** | **1,422,204** |

### 6. OTHER EXPENSES

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Dharma Deshana Expenses | 25,750 | 34,000 |
| Sri Wijayarama Temple Repairs | - | - |
| | **25,750** | **34,000** |

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

NOTES TO THE FINANCIAL STATEMENTS

Year ended 31st December 2016

**7. PROPERTY, PLANT AND EQUIPMENT**

**7.1 Gross Carrying Amounts**

| | Balance As at 01.01.2016 Rs. | Additions Rs. | Disposals/ Transfers write off Rs. | Balance As at 31.12.2016 Rs. |
|---|---|---|---|---|
| **At Cost** | | | | |
| Furniture and Fittings | 169,553 | 37,575 | - | 207,128 |
| Office Equipments and Computers | 216,400 | 57,533 | - | 273,933 |
| **Total Gross Carrying Amount** | **385,953** | **95,108** | **-** | **481,061** |

**7.2 Depreciation**

| | Balance As at 01.01.2016 Rs. | Charge for the year Rs. | Disposals/ Transfers to Rs. | Balance As at 31.12.2016 Rs. |
|---|---|---|---|---|
| **At Cost** | | | | |
| Furniture and Fittings | 65,845 | 26,466 | - | 92,311 |
| Office Equipments and Computers | 192,442 | 54,100 | - | 246,542 |
| **Total Depreciation** | **258,287** | **80,566** | **-** | **338,853** |

**7.3 Net Book Values**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| **At Cost** | | |
| Furniture and Fittings | 114,816 | 103,707 |
| Office Equipments and Computers | 27,391 | 23,958 |
| **Total Carrying Amount of Property, Plant & Equipment** | **142,207** | **127,666** |

**8. CASH AND CASH EQUIVALENTS**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| **8.1 Favourable Cash & Cash Equivalents Balances** | | |
| Cash at Bank Balances | | |
| Meth Saviya Bank Account | 160,603 | 390,803 |
| Sri Sambuddhathwa Jayanthi Buddha Prathima Aramudal Bank Account | 8,822,319 | 9,088,227 |
| Sri Sambuddhathwa Jayanthi Buddha Prathima Aramudal Petty Cash | 4,824 | 4,495 |
| Cash in Hand | 10,000 | 10,000 |
| | **8,997,746** | **9,493,524** |
| **8.2 Unfavourable Cash & Cash Equivalents Balances** | | |
| Cash at Bank Balances | | |
| Meth Saviya Bank Account | - | - |
| | - | - |
| Total Cash and Cash Equivalents for the Purpose of Cash Flow Statement | **8,997,746** | **9,493,524** |




# සඟරාව මුද්‍රණය කිරීම

මෙත් සවිය මගින් ප්‍රකාශයට පත් කරන **"මෙත් සවිය සඟරාව"** මුද්‍රණය කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර, **ඒ සඳහා පිංවත් ඔබටත් බරපැන දායක්වය දැරීමට හැකියාව ඇත.** වැඩි විස්තර සඳහා කාර්යාලය අමතන්න.



# මෙත් සවිය ටී ෂර්ට්

**මෙත් සවිය නාමය සහිත, සුදු පැහැති ටී ෂර්ට් එක රු. 1000/- ක් දී** මෙත්සවිය කාර්යයාලයෙන් ලබා ගත හැක. මින් ලැබෙන ප්‍රතිලාභ සියල්ල **බුදු පිළිම තැනීම සඳහා සහ පුණ්‍ය කටයුතු සඳහා වැයකරනු ලැබේ.**

Meth Saviya Manasa Adyapana Sanwardhana Maithree Sansadaya

NOTES TO THE FINANCIAL STATEMENTS

Year ended 31st December 2016

**9. ASARANA SARANA ARAMUDALA**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Opening Balance | 122,769 | 42,129 |
| Funds received during the year | 88,763 | 80,640 |
| | **211,532** | **122,769** |
| Donation given during the year | - | - |
| Closing Balance | **211,532** | **122,769** |

**10. SRI SAMBUDDHATHWA JAYANTHI BUDDHA PRATHIMA AF**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Opening Balance | 9,092,721 | 5,867,164 |
| Add: | | |
| Donation and Ticket sales income | 4,091,729 | 6,348,774 |
| Non Refundable Tender Fees | 16,500 | - |
| Advance refund- Sculptor | 1,000,000 | - |
| Fund Transfer from Current Account | 4,700,000 | - |
| Fund Transfer from Savings Account | 3,300,000 | - |
| Reimbursment of Petty Cash Expenses | 20,000 | - |
| Interest income-Savings | 454,155 | - |
| Advance Refund-Mahiyanganya | 90,920 | - |
| | **22,766,025** | **12,215,938** |
| Less: | | |
| Advance for Expenses | 20,000 | - |
| Construction Advance | 4,048,302 | - |
| Construction of Foundation | - | 149,365 |
| Fund Transfer to Current Account | 3,300,000 | - |
| Fund Transfer to Savings Account | 4,700,000 | - |
| Reimbursment of Petty Cash Expenses | 20,000 | 21,375 |
| Travelling & Transport | 17,000 | 730,065 |
| Wages & Allowance | - | 84,000 |
| Advertisement | 100,607 | - |
| Expenses on Small Buddha Statues | 118,430 | - |
| Pirikara & Pooja Expenses | 35,991 | 20,600 |
| Printing & Stationery cost | 10,600 | 67,290 |
| Withholding Tax | 36,332 | 14,931 |
| Packing Items | 8,000 | - |
| Refund of Over Deposited Advance | - | 1,000 |
| Advance for Mahiyanganya/Kandy Visit | 333,023 | - |
| Advance for Material Purchase | - | 2,000,000 |
| Accomadation Charges & Refreshment | - | 8,000 |
| CCTV Expenses | 127,600 | - |
| Advance for Sculptor | 1,000,000 | - |
| Purchase of Cupboards | 13,388 | - |
| Purchase of two speaker sets | - | 25,000 |
| Postage | 5,625 | 630 |
| Document Charges | 34,411 | - |
| Internet Expenses | 4,427 | - |
| Tea & Meals | 9,020 | - |
| Bank Charges | 950 | 960 |
| Closing Balance | **8,822,319** | **9,092,722** |

**11. METH SHISHYATHWA ARAMUDALA**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Opening Balance | (52,750) | 20,400 |
| Funds received during the year | 372,600 | 347,350 |
| | **319,850** | **367,750** |
| Donation given during the year | (383,100) | (420,500) |
| Closing Balance | **(63,250)** | **(52,750)** |

**12. NIWASA ARAMUDALA**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Opening Balance | 12,000 | 12,000 |
| Funds received during the year | - | - |
| | **12,000** | **12,000** |
| Donation given during the year | - | - |
| Closing Balance | **12,000** | **12,000** |

**13 Sathun Nidaskirime Aramudala**

| | | |
|---|---|---|
| Opening Balance | - | - |
| Funds received during the year | 36,190 | - |
| | **36,190** | - |
| Donation given during the year | - | - |
| Closing Balance | **36,190** | - |

**14 ACCRUED EXPENSES AND OTHER PAYABLES**

| | 2016 Rs. | 2015 Rs. |
|---|---|---|
| Audit Fees Payable | 15,000 | 15,000 |
| Administration Expenses Payable | 178,040 | 178,040 |
| | **193,040** | **193,040** |

**විගණකවරුන් විසින් අත්සන් කරන ලද සම්පූර්ණ ගිණුම් වාර්තාව අවශ්‍යය නම් සාමාජිකයින්ගේ අධීක්ෂණය සඳහා මෙත්සවිය කාර්යාලයේ තබා ඇත.**

## සිත් තුළින් පිදුම් ලත් වදන්

1. බෝසත් ගුණපිරි බෝසත් රුවඇති පින්කෙත වන්
අප වෙතැ පැයූ ස්වර්ණ ප්‍රභාශ්වර හිරු දෙව් වන්
මුදු සිසිලස දී සිත් නිවනා සඳ දෙව්දුන් වන්
මේ මනුලොව අප දකින කළණ මිතුරාණනේ
ඔබ පා පියුම් වඳිමු බැතින් !

2. පින පව කුසලාකුසල මඟ නොමඟ තෝරා දී
බවුන් වඩා අප යා යුතු ජයමඟ පෙන්වා දී
නිවනට මඟ පෙන්වා රුදු සංසාරයෙන් මි දී
කඳුලු සලන්නන් මුවගෙහි හසරැළි රඳවාලන
ඔබේ පා පියුම් වඳිමු බැතින්

3. මෙත් සවිය දරුවන් රකින වඩන පියතුමෝ ඔබ යි
මෙත් සවි සිසු සිත් ප්‍රඥාව වඩවන ඇදුරු ඔබ යි
සම්මතැ පිහිටා සැමට දයාවෙන් ඔවදන් දෙයි
විශ්වය හඳුනා තුන්ලොව තොරතුරු අපට බෙදන
ඔබේ පා පියුම් වඳිමු බැතින්

පින් ඇතියන් ඔබ ඇසුරෙහි ආලෝකවත් ව දිලෙයි
සෙත් ! චන්දන ජයරත්න මැතිඳු තෙරුවන් සරණයි !

හේලිඅමා සෙනරත් (5-1093)

## තුති කුසුම්

**පහත වැඩසටහන් සඳහා**
**ආධාර පරිත්‍යාග ලබා දුන් සුපින්වතුන් හට**
**මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම**
**ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

## සඳහම් චාරිකාව

**මිහින්තලය කළුදිය පොකුණ ආරණ්‍ය සේනාසනය**
**දාන - සීල - භාවනා වැඩසටහනට**
**2017 / 02 / 05 වන ඉරු දින පිරිකර සඳහා ආධාර කළ පිංවතුන්**



01. බඩල්ගම ධම්ම නන්දනී භික්ෂුණිය
02. සුමනා ප්‍රේමරත්න මහතා
03. දීපාල් ආටිගල මහතා
04. එන්. ඩී. එන්. එල්. කුමාර මහතා
05. හර්ෂ ජයවීර මහතා
06. එස්. එම්. එදිරිසූරිය
07. එම්. ඒ. ඥාණවතී මහත්මිය
08. මාලන් ප්‍රේමචන්ද්‍ර මහතා
09. සමුද්‍රිකා වීරපුර මහත්මිය
10. පාලිකා පෙරේරා මහත්මිය
11. හෙට්ටිආරච්චි
12. අනෝමා මහත්මිය
13. දිලිනි මදූෂා මහත්මිය
14. ඩබ්. ඒ. ඩී. එන්. එස්. කුමාර මහතා
15. මුදිතා වික්‍රමසිංහ මහත්මිය
16. නන්දනී සේරසිංහ මහත්මිය
17. මාලන් ලසිත් මහතා
18. ලසන්ත පෙරේරා මහතා
19. ඩබ්. ඩී. සී. පෙරේරා
20. සිරි හේවාවිතාරණ මහතා
21. සුමනා හේවාවිතාරණ මහත්මිය
22. එස්. එම්. වික්‍රමසිංහ
23. රංජිත් සොයිසා මහතා
24. ඩබ්. සී. කොඩිතුවක්කු
25. එදිරිසිංහ
26. ඩබ්. නන්දනී අබේධීර මහත්මිය
27. ඩබ්. ඩී. සී. පෙරේරා
28. සුභාෂිනී පරමනාදන් මහත්මිය
29. සහනි හල්පිටියගේ මහත්මිය
30. ශාමා පෙත්තවඩු මහත්මිය
31. චාමලී අමදෝරු මහත්මිය
32. වික්‍රම ගුණදාස මහතා
33. දර්ශන ගලප්පත්ති මහතා
34. චමින්ද වෙදගේ මහතා

## 2017 / 03 / 05 වන දින පැවති මෙත් සවිය
## අධ්‍යාපන වැඩමුළුව සඳහා දායකත්වය දැක්වූ සුපින්වතුන්

| | | |
|---|---|---|
| 35-5440 | කේ.එම් රේණුකා ජයන්ති | 500.00 |
| 03-686 | නිහාල් පුංචිහේවා | 1000.00 |
| 35-5413 | චන්ද්‍රිකා මුණසිංහ | 2500.00 |
| | වික්‍රම ගුණදාස | 2000.00 |
| 34-5329 | ජයන්ත ගමගේ | කිරි පැකට් |

## 2017 / 04 / 02 වන දින පැවැත්වෙන
## 14 වන සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල සඳහා ආධාර උපකාර කල සුපින්වතුන්

1. මහේන්ද්‍ර ජයනාත් බ්‍රිටෝ මහතා - සඟරාව මුද්‍රණය සඳහා රු. 66,000/-
වතුර බෝතල් 500 ක්,
කිරි පැකට් 450 ක්
2. විපුලතේජ විශ්වනාත් අපොන්සු මහතා - සමරු තිළිණ බුදුපිළිම රු. 30,000/-
3. ඩී. ඒ. ජයරත්න මහත්මිය - ධර්ම දේශනාව සහ බෞද්ධයා නාලිකාවේ විකාශනය සඳහා රු. 33,000/-
4. එම්. ආර්. නිලංගනී මහත්මිය - ධර්ම දේශනාව සහ බෞද්ධයා නාලිකාවේ විකාශනය සඳහා රු. 25,000/-
5. දර්ශන ගලප්පත්ති මහතා රු. 25,000/-
6. ඕ. පී. එල්. ඩබ්. සෙනවිරත්න මහතා රු. 3,000/-
7. තමරා සමරවීර මහත්මිය රු. 1,000/-
8. ඉන්ද්‍රජිත් පෙරේරා මහතා රු. 500/-
9. කේ. පී. ආර්. දූල්වල රු. 500/-
10. අයි. ඒ. කේ. පී. පෙරේරා රු. 500/-
11. ශිරන්ත ඉලංගරත්න මහතා රු. 10,000/-

# චුල්ල බෝධි ජාතකය

## කෝපය උපන්නත් වහා සංසිඳුවා ගන්න

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක් එක් කිපෙන සුලු භික්ෂුවක් ඇරැබැ මෙය වදාල සේක.

එක් භික්‍ෂුවක් තද ය, රළු ය, ක්‍රෑර ය, වහා කිපෙන සුලු ය. භාග්‍යවතුන් වහන්සේ එ පවත් අසා, 'තොප කෝපී වැ වසන්නා සැබෑ දෑ?' යි විචාරා, "සැබෑව, වහන්සැ" යි ඔහු කී කලැ, "තොප කෝප නැති බුදු සස්නෙහි මහණ වැ කෝපී වන්නට කරුණු කිම් ද? පෙර උතුමෝ බුදු සස්නෙන් පිටත් තවුම් බව්හි සිටත් කිපෙන්නට කරුණු ඇති වූ තැනදීත් නො කිපුණෝ වෙත් දෑ !" යි වදළ සේක. භික්‍ෂුහු "ඒ කෙසේ දැ?" යි වදරන සේ ඇයැදූහ. භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන ඉකුත් වත වදළ සේක :

පෙර බරණැස් නුවර බඹදත් නම් රජකු රජය කරවන සමයෙහි, එක් බමුණු ගෙයක චුල්ලබෝධි නම් කුමරෙක් විය. හේ වැඩිවිය පැමිණ තක්සලා නුවර ගොස් දිසාපාමොක් ඇදුරු වෙත සිප් සතර ඉගෙන පෙරළා අවුත් මා පියනට තමා උගත් දෑ දැක්වී ය. මා පියෝ පැහැ ද සුදුසු කුලයෙකින් තරුණියක ගෙනැවිත් ඔහුට පාවා දෙන්නට උත්සාහ කළහ. හේ "මට භාර්‍ය්‍යාවක ගෙන් කාරියෙක් නැත. මම තපසට යෙමි" යි කියා මාපියන් බසට කැමැති නොවී ය. එහෙත් මා පියෝ සමාන කුලයෙකින් කුමරියක ගෙනවුත් ඔහුට පාවා දුන්හ.

චුල්ලබෝධී තෙම මා පියන් මළ පසු තමා සතු වූ මහත් සම්පත් බලා "මේ හැම වස්තුව ගනිවු යැ"යි බිරින්දෑට කී ය. "මට සම්පත් පාවා ගන්නට කියන්නේ ඔබ කොයි යෙත් දැ?" යි ඕ ඇසුවාය. "මම් හිමාලයට තපසට යෙමි" යි හේ කී ය. "ඇයි, ස්ත්‍රීනට තපස් කරන්නට නපුරු දෑ?"යි ඕ පුළුවුත, "නපුරු නො වෙයි තොපට හැකි නම් තපස් කරවු" යැ යි හේ කී ය. ඉක්බිති ඔහු දෙදෙනා ම තමන් සතු සම්පත් පිනට දී හිමාලය වනයට ගොස් තවුස් පැවිදි ගෙන දස හවුරුද්දක් මනා වවැ සිල් රැක්කහ. නැවත එක් වරෙක ලුණු ඇඹුල් සෙවුනා පිණිස ඔහු දෙ දෙන මිනිස් පියට ආහ. අවුත් බරණැස් රජු ගේ උයනෙහි වසත්.

දවසෙක බරණැස් රජ උයන් කෙළි පිණිස ගොස් උයනේ ඒ ඒ තැන හැවිදින්නේ චුල්ලබෝධි තාපසයන් හා තපස්විනීත් දිටි ය. දැක, රූමත් තපස්විනිය කෙරේ ඇලුම් ඇති වැ තාපසයන් අතින් ඇගේ පවත් විචාරන්නේ "වහන්ස, මෙ පරිබ්‍රාජිකාවෝ ඔබේ කවුරු දෑ?" යි ඇසී ය. "මහරජ, මේ මා හා එක් වැ තපස් කරන කෙනෙක, එසේ වුවත් පෙර ගිහි කලැ නම් මා බිරින්දෑ"යැ යි තාපසයෝ කීහ.

එවිට රජ තෙම "මෙ තවුසාට කෝප ඇද්ද නැද්දැ? යි පිරික්සමි" යි සිතා, "තාපසයන් වහන්ස, යමෙක් මේ පරිබ්‍රාජිකාව බලෙන් උදුරා ගෙන යේ නම් ඔබ කිපෙත් දෑ? "යි විචාළේය.

තාපසායෝ කියන්නෝ "මහරජ, රහත් නො වූ බැවින් කෝප ඇති නොවෙතැ යි කිය නො හැක්ක. ඉදින් කෝපය ඇති වුවත් ඇවිලුණු ගින්න පැන් සලා නිවන්නා සේ ඒ ඇතුළත හටගත් කෝපය ඇතුළත ම නිවාලමි" යි කීහ.

ඉක්බිති රජ තෙම ඇමැතියකු කැඳවා "තෙපි පරිබ්‍රාජිකාවන් රජ ගෙට ගෙන යව" යි කී ය. අමැත්තාත් ඇය අත අල්ලා ගෙන ඇය හඬද්දී ම බලෙන් රජ ගෙට ගෙන ගියෝ ය. ඇය හඬන්නා අසා තාපසයෝ කර ඔසොවා බලා කිසිත් නොකියා උන්හ.

රජ ද රජ ගෙට ගොස් ඇය කැඳවා, "තොප මාගේ අග මෙහෙසුන් කරමි. මේ තපස් කැරුමෙන් මොන වැඩෙක් දැ ?" යි කීය.

"මහරජ, තොප සැපතින් ප්‍රයෝජන නැත. මට තපස් රැක්ම ම උතුම්"යි තපස්විනි කීවා ය.

එ විට රජ "ඇය එක් ගෙයක ලවා, තාපසයෝ උරණ ඇද්දෝ නැද්දෝ"' යි විමසනු පිණිස තනි වැ උයනට ගියේ ය. ගොස් පිය සන් නො ඇසෙන සේ තවුසාණන් ඉන්නා තැනට ගියේ ය. එ වේලෙහි තාපසයෝ පරණ වැහැරියක් ගොතන්නෝ රජ ආ බව නො දැන කිසිත් නො බැණ උන්හ.

එ විට රජ "ඇයි, තාපසයන් වහන්ස, දිවි ඇති තෙක් කෝප නො කරමි"යි කියා නො වේ ද ඔබ කීයේ ? මා අවුත් සිටිනා මෙතෙක් වේලා බැණ නො නැංගේ කෝප නැත්තෙක් ද?" යි කීය.

එ විට තාපසයෝ කියන්නෝ "මහරජ, එය මට උපන්නේ ය. නො උපන්නේ නොවේ. එහෙත් එය සිත රැඳෙන්නට නො දුනිමි. නැංග දූලි රැෂ එ විට වැසි වැස නිවාපුවා සේ ම හට ගත් එය මෙත් වඩා සංසිඳුවාපීමි" යි කී හ.

රජ එය අසා "මොහු මෙ කියනුයේ කෝපය ගැන ද නැතහොත් අන් කිසිවක් ගැන දැ?" යි විමසන්නේ ''කුමක් ඔබට උපන්නේ ද? කුමක් සිත රැඳෙන්නට නොදුන්නෝ ද? කුමක් සංසිඳුවාලූවෝ දැ?" යි ඇසී ය.

තාපසයෝ "ක්‍රෝධය මහත් දොස් ඇති එකෙක. මට එය හටගන්නේ ය. එහෙත් එය මෙත් වැඩීමෙන් නිවාපීමි" යි කියා ක්‍රෝධයේ දොස් විස්තර කොට වදාළහ.

රජ එය අසා සතුටු වැ ඇමැතියකු බණවා, තපස්විනිය ගෙන්නා "ක්‍රෝධ නො කරන තවුසාණන් වහන්ස, ඔබ දෙ දෙනා වහන්සේ ම පැවිදි සැපයෙත් මේ උයන්හි ම වසන සේක් වා. මම ඔබ රක්නෙමි" යි කියා වැද කෂාම කරවා ගෙන නික්ම ගියේ ය.

පසු කළෙක පරිබ්‍රාජිකා මළාය. චුල්ලබෝධි තාපසයෝ හිමවතට ගොස් අභිඥා හා සමාපත්ති උපදවා මරණින් පසු බඹලොවැ උපන්හ.

භාග්‍යවතුන් වහන්සේ මේ කථාව ගෙන හැර දක්වා සිවු සස් වදළ සේක.

මෙය ඇසූ කිපෙන සුලු මහණ තෙම අනාගාමි ඵලයෙහි පිහිටියේ ය.

ඉක්බිති 'එද පරිබ්‍රාජිකාවෝ නම් අද රාහුල මාතෘහු යය. බරණැස් රජ නම් අනඳ තෙර ය. චුලලබෝධි පරිබ්‍රාජක නම් මම ම යැ" යි පූර්‍වාපර සන්ධි ගළපා ජාතකය නිමවා වදළ සේක.

**"ක්‍රෝධය ඇති වන්නට හැක්ක.**
**එහෙත් එය වහා නිවා ගත යුතු ය."**

# අෂ්ට ලෝක ධර්මය

**" ලාභො අලාභො අයසෝ යසෝ ච**
**නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං**
**එතේ අනිච්චා මනුජේසු ධම්මා**
**අසස්සතා විප්පරිණාම ධම්මා "**

ලාභය, අලාභය, යසස ය, අයස ය, නින්දාව ය, ප්‍රශංසාව ය, සැපය ය, දුක ය යන මේ ධර්ම අට ලෝක ධර්ම යයි කියනු ලැබේ. මෙලොව වෙසෙන සෑම මිනිසකු කරා ම ඒ ධර්මයෝ වරින් වර පැමිණෙති. චක්‍රයක් සේ කැරකෙන ඒ ධර්මයන් ගේ පැමිණීම අවස්ථාවෙන් අවස්ථාවට සිදුවන නිසා සාමාන්‍ය මිනිසකුට තබා සිටුවරයෙකුට රජ කෙනෙකුට වුවද සෑම කල්හි එක් තත්ත්වයෙන් ම වාසය කරන්නට නොලැබේ.

ලෝක ධර්මයන් අතුරෙන් ලාභය යනු ආහාර පාන වස්ත්‍ර මිල මුදල් ආදිය ලැබීමය. අලාභය යනු ලැබූ දෑ නැති වී යෑම හා ඉදිරියට නොලැබී යෑම ය. කලෙක බොහෝ ලාභ ඇති ව පොහොසත්ව සිටින තැනැත්තා කරා කලදී අලාභය පැමිණෙන්නේ ය. කලක් අලාභයෙන් හෙවත් දිළිඳු කමින් පීඩිත තැනැත්තා කරා කලෙක ලාභය පැමිණෙන්නේ ය. මෙසේ මිනිසාට ලාභ අලාභ දෙක චක්‍රයක් සේ කැරකෙන්නේ ය.

යසස යනු තමා හා එක් ව හැසිරෙන තමාගේ කටයුතුවලට සහභාගී වන පිරිසය. අයසය යනු එබඳු පිරිසක් නැති බව ය. කලෙක මහ පිරිසක් ඇති ව සිටි තැනැත්තා කලෙක මඳ පිරිසක් ඇතියෙන් හෝ තනි වූවෙක් හෝ වේ. තමා අනුව හැසිරෙන කිසිවෙකු නැතිව තනි ව සිටි තැනැත්තා හට කලෙක මහපිරිස් ඇති වේ. මෙසේ දෙ චක්‍රයක් සේ මිනිසා කරා වරින් වර පැමිණේ. කීර්ති අපකීර්ති දෙකට ම යසඅයස යයි කියනු ලැබේ.

කලෙක බොහෝ දෙනාගෙන් ගැරහුම් ලබමින් විසූ තැනැත්තා කලෙක බොහෝ දෙනාගෙන් පැසසුම් ලබන්නේ ය. කලෙක පැසසුම් ලැබූ තැනැත්තා නැවත කලෙක ගැරහුම් ලබන්නේ ය. මෙසේ නින්දා ප්‍රශංසා දෙක වරින් වර මිනිසා කරා පැමිණේ.

කලෙක සැප සේ විසූ තැනැත්තා කරා කලෙක දුක් පැමිණෙන්නේය. කලෙක දුකින් සිටි තැනැත්තා කරා කලෙක සැප පැමිණෙන්නේය. මෙසේ සුව දුක් දෙක වරින් වර මිනිසා කරා පැමිණේ. අටලෝ දහම යනු ලෝකයේ පවතින ස්වාභාවය හෙවත් ධර්මතාවයයි. **"පට්ඨස්සලෝක ධම්මෙහි චිත්තං යස්සනකම්පති"** යනුවෙන් මංගල සූත්‍රයෙහිදී අටලෝ දහමෙහි කම්පානොවන ගතිය මංගල කරුණක් ලෙස දක්වා ඇත.

ලෝක ධර්මයන්ට අනුව පෙළෙන මිනිසා විසින් ඒවා පිළිබඳ මනා දැනුමක් ඇතිව විසිය යුතුය. ලෝක ධර්මයන්ගේ තතු නොදත් නුවණ මඳ පුද්ගලයා ලාභය ය, පිරිවර ය, ප්‍රශංසාව ය, සැපය ය යන අෂ්ට ලෝකධර්මයන් ලබා සිටින අවස්ථාවේ දී ඒවා නිසා උඩඟු වී තමා උසස් කොට ද අන්‍යයන් පහත් කොට ද සිතති. ඒවායින් මත් ව නොයෙක් නො මනා කම් කොට දෙලොවින්ම පිරිහෙති. අලාභය ය, පිරිස් නැති බවය, නින්දාව ය, දුකය ය යන නොමනා ධර්මයන්ට මුහුණ පාන්නට වූ අවස්ථාවේදී බොහෝ තැවෙන්නේය. අන්‍යයන්ට වෛර කරන්නේය. අන්‍යයන්ට ඊර්ෂ්‍යා කරන්නේය. එසේ කොට දෙලොවින් ම පිරිහීමට පැමිණෙන්නේය. ලෝක ධර්මයන්ගේ සැටි තේරුම් ගත් තැනැත්තා විසින් ලාභාදිය ලබා සිටින අවස්ථාවේ දී ඒවායේ ඇති අස්ථිර ස්වභාවය පෙරළෙන ස්වාභාවය සලකා උඩඟු නොවන්නේය. මත් නොවන්නේය. ලාභාදිය ඇතියන්ට ක්‍රෝධ, ඊර්ෂ්‍යා නො කරන්නේය. දුප්පත්කම නිසා නො මනාකම් නො කරන්නේය. තමා පහත් කොට ද නොසිතන්නේය. ලාභාදිය ඇතිවුන් උසස් කොට ද නොසිතන්නේය. මෙසේ ලෝක ධර්මයන් ගැන මැදහත් ව සිතන නුවණැති මිනිසා දෙලෝ වැඩ සිදුකර ගන්නේය. ලෝක ධර්මයන් කෙරෙහි සම ව පැවැත්ම උසස් අදහස් ඇති උත්තම පුද්ගලයන් ගේ ස්වභාවයකි. ලෝක ධර්මයන් නිසා උඩඟු වීම හා ශෝක කිරීම හීනයන්ගේ ස්වභාවයකි.

## ලෝක ධර්මයන් කෙරෙහි සැලකිය යුතු කරුණු

**" ධම්මේන ච අලාභො යො**
**යො ච ලාභෝ අධම්මිකො**
**අලාභො ධම්මිකෝ සෙය්‍යො**
**යං චෙ ලාභෝ අධම්මිකො "**

" ධර්මයෙන් වන්නා වූ අලාභය සහ අධර්මයෙන් වන්නා වූ අලාභය ය යන මේ දෙකින් අධර්මයෙන් වන අලාභයට වඩා ධාර්මික අලාභය ම උතුම් ය " යනු එහි අදහසයි.

**" යසෝ ච අප්පබුද්ධීනං**
**විඤ්ඤූනං අවසො ච යො**
**අයසො ච සෙය්‍යො විඤ්ඤූනං**
**න යසො අප්පබුද්ධිතං "**

" මන්දබුද්ධිකයන් නිසා වන කීර්තිය ය, නුවණැතියන් නිසා වන අපකීර්තිය ය යන දෙකින් මන්දබුද්ධිකයන් නිසා ලබන කීර්තියට වඩා නුවණැතියන් නිසා ලබන අපකීර්තිය ම උතුම් ය " යනු එහි අදහසයි.

**" දුම්මෙධෙහි පසංසා ච**
**විඤ්ඤූහි ගරහා ච යා**
**ගරහා ච සෙය්‍යො විඤ්ඤූං**
**යං චෙ බාලපස්සංසනා "**

" අඥයන් විසින් කරන ප්‍රශංසාව ය, විඥයන් විසින් කරන ගර්හාවය යන දෙකින් බාලයන්ගේ ප්‍රශංසාවට වඩා විඥායන්ගේ ගර්හාව ම උතුම් වන්නේය " යනු එහි අදහසයි.

**" සුඛං ච කාමෙමයිකං**
**දුක්ඛඤ්ච පවිවෙකියං**
**පවිවෙකියං දුක්ඛං සෙය්‍යො**
**යං වෙ කාමමයං සුඛං "**

" කාමසුඛය ය, විවේකයෙන් වන දුක ය යන දෙකින් කාම සුඛයට වඩා විවේකයෙන් වන දුක ම උතුම් ය" යනු එහි තේරුමයි.

# ඒකපණ්ණ ජාතකය

## කිසිදා නොකිපෙනු, ඉවසන්න, මෙත්වඩන්න.

භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහ වනයේ කුටාගාර ශාලා මහා විහාරයෙහි වැඩවසන සේක ක්‍රෑර ලිච්ඡවි කුමරකු ඇරැබෑ මෙය වදළ සේක.

විසාලා මහනුවර එක් ලිච්ඡවි කුමාරයෙක් චණ්ඩ ය. පරුෂය, බසක් කියතොත් ගහලා බැණලා ම කියයි. හැම විට ම දංඩෙන් පහර ලත් සර්පයෙකු සේ කෝපයෙන් දිලිහි ගන්නේ ය. මා පියොන් සෙසු හැම දෙනාත් ඔහු කෙරෙහි මහත් බියෙන් කල් යවත්, ඔහු හික්මවන්නට කිසි නෑදැයෙකු සමත් නොවිය. දවසෙක මා පියෝ ඔහු කැටුව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් ඔහු ගේ සැටි පවස, 'මොහුට අවවාද කරන සේක්වා' යි භාග්‍යවතුන් වහන්සේ අයැදූහ.

භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ අවවාද කළ සේ. :

"දරුවා, මේ සතුන් කෙරෙහි හැඩි දැඩි රළු පරොස් නො වියැ යුතු.

පරොස් බස නම වැදූ මවට ද පියාට ද පුතුට ද සොහොයුරු සොහොයුරියනට ද බිරියට ද නෑ මිතුරනට ද අප්‍රියත් අමනාපත් වෙයි. හෙතෙම සපන්නට එන සපකු මෙන් ද වෙනෙහි, නැගී සිටි පල් සොරකු මෙන් ද තමන් කන්නට එන යකකු මෙන් ද ඒ නැමිතුරු ආදීනට තැති ගැන්ම ඇති කෙරෙයි. මරණින් පසු නිරයෙහි ඉපිද දුක් විඳින්නේ ය. ක්‍රෝධ කරන සුලු තැනැත්තේ හැඳ පැලැඳ මැනවින් සැරැසුණෝ ද මේ ලෝහිදී ම දුර්වණී වෙයි. ඔහුගේ මුහුණ පුන් සඳ මඬලක් සේ සිරිමත් වුව ද ගිනි දුම වැද ගත් පියුමක් සේ නිශ්ශෝභ වෙයි. නපුරු පෙනුම් ඇත්තේ වෙයි. සත්ත්වයෝ ක්‍රෝධය නිසා තුමු, තමනට ම පහර දී ගතින්, විස කත්, බෙල්ලැ වැල ලා ගෙන හෝ මියෙත්. මහ පල්ලම්වලට පැන නො නසිත්, මෙ සේ මැරී නිරයේ ඉපිද බොහෝ දුක් විඳිත්, නැවත මිනිස් වැ උපන්නත් උපන් ද පටන් නිතර ලෙඩින් පෙළෙන්නෝ වෙති. ඇස් ලෙඩ කන් ලෙඩ ආදි ලෙඩවලින් එකක් සුව වන විට තවෙකෙක් වැලඳෙයි. ලෙඩින් නො මිදුණෝ වැ නිතර ම දුකින් පසුවෙත්. එබැවින් හැමදෙනා කෙරෙහි මෙත් සිතින් ඉත සිතින් මොළොක් සිතින් විසිය යුතුය. මෙසේ මෙත් සිතින් කල් යවන්නෝ නිරය භයාදියෙයන් මිදෙත්."

මේ අවවාද ඇසු තැන් පටන් හෙතෙම ඉවසන සවභාවය ඇති වැ මෙත් සිතැති වැ ශාන්ත වැ දාන්ත වැ කල් යැවීය. භාග්‍යවතුන් වහන්සේ ඒ කුමරු හික්මැවූ සැටිය ගැන භික්ෂූහු දම් සබායෙහි කතා කරමින් හුන්හ. එ විට භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ, එ පවත් අසා, පෙරත් මම මොහු හික්මැවිමි යි වදරා මේ ජාතකය දෙසූ සේක. :

"එක් කලෙක බමුණු කුලයෙක ගුණ නුවණැති දරුවෙක් විය. එතෙම දෙමාපියන් කළුරිය කලාට පස්සේ ගිහි සැප හැර දමා තපස් රකින්නට හිමාලය වනයට ගියේ ය. කලින් කල ඒ තාපසයා ලුණු ඇඹුල් සොයාගෙන බරණැස් නුවරට ආයේය. දවසෙක නගරයේ පිණ්ඩපාතයේ යන මෙ තවුසා දුටු බරණැස් රජ පැහැද 'තාපසයා එක්ක එන්නැ'යි කියා අමාත්‍යයන් යැවී ය. අමාත්‍යයෝත් ගොස් රජුගේ පණිවුඩය කීහ. එවට තවුසා, "මා රජ්ජුරුවන් හඳුනන්නේ නෑ. රජ්ජුරුවන් සමග මාගේ යාළු කමකුත් නෑ. මම හිමාලය වනයේ ඉඳලා ආ තාපසයෙක්" කියා රජ මාලිගාවට යන්නට කැමති නොවී ය. ඇමැතියෝ මේ බව රජුට කීහ. ඒ ඇසූ රජතුමා "ඔබ වහන්සේ හැර තාපසයකු අප දැකලා නැත. වෙන යහළු තවුසෙකුත් අපට නැත. එ හෙයින් මෙහි වැඩම කරන්නැය" දෙවන වරටත් කියා යැවී ය. තාපසයාත් රජ මාලිගාවට වැඩියේ ය. රජ තෙම තාපසයා වැඳ සත්කාර කැරැ 'ඔබ වහන්සේ කොහේ වඩිනවාදැ' යි ඇසී ය. 'හිමාලය වනයේ ඉඳලා වැසිකාලය පැමිණ හෙයින් වස් වසන්නට හොඳ තැනක් සොයා ගෙන යනවා යැ'යි තාපසයා කී ය. රජතෙම තමා ගේ උයනේ වස් වසන්නැ යි තවුසා අයැදී ය. තාපසයාත් කැමැති විය. ඉන්පසු රජ තවුසා සමග උයනට ගොහින් වස් වස්වා, අත් පා මෙහෙවර කරන්නට උයන බලාගන්න මිනිහාට බාර කලේය ඒ රජ්ජුරුවන්ට නපුරු පුතෙක් විය දෙමාපියන් කියන දෑ වත් හේ නොඅහන්නේ ය. මේ නිසා කවුරුත් ඒ කුමාරයාට දුෂ්ට කුමාරයා යැ යි නම් කළහ. රජ මේ කුමාරයා හොඳට හද ගන්නට ඕනෑ කෙළේය. එක් දවසක් රජ මේ දුෂ්ට කුමාරයාත් එක්ක තාපසයා බලන්නට ගොහින් තාපසයාට තමාගේ පුතාගේ ඇති නරක ගති ටික කියා ඔහු හොඳ කෙනෙකු කැර දෙන්නැ යි කුමරු තාපසයාට බාර දී මාලිගාවට ගියේ ය. තාපසයාත් දුෂ්ට කුමාරයා අතින් අල්ලා ගෙන උයනේ එහාට මෙහාට ඇවිද්දේ ය. එසේ ඇවිදින ගමන් එක තැනකදී යම් තම් පෙති දක එළියට ඇදුණු කොහොඹ පැලයක් කුමාරයාට පෙන්වා එයින් එක පෙත්තක් විකා බලන්නැ යි කීය. නපුරු කුමාරයාත් ඒ පුංචි කොහොඹ පැලෑටියේ එක පෙත්තක් සපා තිත්ත නිසා ඒ පැලය උදුරු පාගා පොඩි කැර දැමී ය. තාපසයා එවිට ඒ කුමරයා ගෙන්

කොහොඹ පැලය එසේ පොඩි කැර දමන්න හේතුව ඇසී ය. එවිට දුෂ්ට කුමාරයා "තාපසයන් වහන්ස, මෙච්චර පුංචි කාලයේ මේ කොහොඹ පැලය මෙ තරම් තිත්ත නම් වැඩී ලොකු ගසක් වුණා ම කොච්චර තිත්ත වේද? ඒ නිසා එය දැන් ම ගලවා දැමීමි"යි කී ය. ඒ ඇසූ තාපසයා "බලන්න, කොහොඹ පැලය තිත්ත වූ නිසා එය වැඩෙන්නට නොදී ඔබ ගලවා දැමූවා. ඒ වගේ ම ඔබ කුඩා කාලයේ ම නපුරු යැ යි චණ්ඩයැ යි අමාත්‍යයනුත් රට වැසියාත් පිළිගත්තොත් 'මොහු රජ වුණා ම කොතරම් නපුරු වේවි ද?" කියා, පුංචි කාලේදී ම පාගා විනාශ කැර දමන්නට පුළුවන. ඒ නිසා දැන් සිටම නපුරු කම් චණ්ඩකම් අත හැර දමන්නැ'යි අවවාද කෙළේය. කුමාරයාට ද කාරණය සිතැ කා වැදිණ. එතැන් සිට ඒ කුමාරයා ගුණවත් විය.

"එදා දුෂ්ට කුමාරයා මෙදා ලිච්ඡවී කුමරු ය. ඔහුට ඔවා දුන් තවුසා තමන් වහන්සේම" යි වදාළ සේක.

(අනුන් ගෙන් උදවු උපකාර ලබන්නට හිත ඇත් නම, ගරු බුහුමන් ලබන්නට කැමැති නම්, ප්‍රධානයකු වන්නට ආශා නම්, හොඳ ගති පුරුදු කැර ගෙන නරක ගති හැර දමන්නට ඕනෑ බව මතක තබා ගත යුතුය. )

මෙහි පළමු කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

## 2 වන කොටස...

### 1. ජාතිමදෝ 2. ගොත්තමදෝ

අධික ව මත්පැන් පානය කළ අයට ඇත්ත නැත්ත නොදැනෙන, කළ යුත්ත නොකළ යුත්ත නොදැනෙන, ගරු කළ යුත්තන් කීකරු විය යුත්තන් නොදැනෙන, තමා ම ලෝකයේ ශ්‍රේෂ්ඨයා ය, සපනාය, උගතාය, නැණවතා ය කියා හැගෙන මහා සම්මෝහයෙන් යුත් උඩගුවක් ඇති වේ. එයට **මත**යයි ද කියනු ලැබේ. සුරා මදය දිගු කළක් නො පවතී. පැය ගණනකින් සන්සිඳේ. ලෙහෙසියෙන් නො සන්සිඳෙන බැවින් ද බොහෝ කල් පවත්නා බැවින් ද සුරා මදයට වඩා නපුරු අනර්ථකර **මද සත්විස්සක්** ඇත්තේ ය.

මනුෂ්‍යයෝ සිංහල දෙමළ මුස්ලිම් බුරුම සියම් චීන ජපන් යනා දී නම්වලින් ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී නම් වලින් ද කොටස් වලට බෙදී සිටිති. ඒ කොටස් **ජාති** නම් වේ. එක් එක් ජාතියක් ද තවත් නොයෙක් නම් වලින් කුඩා කොටස් වලට බෙදී සිටී. ඒ කොටස් **ගෝත්‍ර** නම් වේ. ඇතැම් ජාතියක් ඇතැම් ගෝත්‍රයක් උසස් කියා ද ඇතැම් ජාතියක් ගෝත්‍රයක් පහත් කියා ද සම්මුති ඇත්තේ ය. තමන්ගේ ජාතිව ගෝත්‍රය උසස් යයි පිළිගන්නා අයට ඒ නිසා **සෙය්‍යමානය** ද පහත් යයි පිළිගන්නා අයට **හීනමානය** ද ඇති වේ.

ජාතියෙන් කුලයෙන් ගෝත්‍රයෙන් තමා උසස් ය කියා ඇති වන මානය මෝහයේ සහාය ලැබීමෙන් ක්‍රමයෙන් ක්‍රමයෙන් දියුණු වේ. මෙම උසස් ජාතියක උසස් කුලයක කෙනෙක් වෙමි. මම උසස් කෙනෙක් වෙමි. සෙස්සෝ පහත් අය ය. මා ඔවුන්ගෙන් වෙන් ව විසිය යුතුය. ඔවුන් හා එක් ව කටයුතු නොකළ යුතුය. ඔවුන්ගේ වැඩ වලට මා සහභාගී නො විය යුතුය. ඔවුන් මට ගරු කළ යුතුය. සැලකිලි කළ යුතුය. කීකරු විය යුතුය යන සම්මෝහයෙන් යුක්ත ව දියුණු වූ මහත් වූ බලවත් වූ මානය **ජාති මද** නම් වේ. ගෝත්‍රය නිසා එසේ ඇතිවන මානය **ගෝත්‍ර මද** නම් වේ. මේ මදය එක්තරා සියුම් උමතු බවෙකි.

**මේ ජාති කුල ගෝත්‍ර මද වලින් මත් වී සිටින අය බෙහෙවින් ඇත්තේ ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ය. එය මෙ දෙරටට බලවත් පිරිහීමේ හේතුවක් ව ඇත්තේ ය.** ජාති මද ගෝත්‍ර මද නිසා කෙනෙක් තමා උසස් ය, සෙස්සෝ පහත් යයි සිතා ගෙන සිටියාට සෙස්සෝ එය නො පිළිගනිති. තමා පහත් යැයි කීමට කැමති කෙනෙක් ද නැත. එබැවින් සෙසු අය තමා උසස් ය කියා ගෙන සිටින තැනැත්තාට සතුරුය. ඔහුට කිසි කරුණකට සෙස්සන්ගේ සහයෝගය නො ලැබේ. සෙස්සන් ඒ උසස් කම නො පිළිගන්නේ නම් උසස් ය කියා තමා ගැන තමා සිතා ගෙන සිටීමෙන් ඇති යහපතක් නැත. එයින් ඇත්තේ තමා අප්‍රිය කරන සතුරු පිරිසක් ඇති වීම පමණකි. ඇතැම්හු ජාති මද ගෝත්‍ර මදයන් නිසා තුමූ නිර්ධන ව සිට පොහොසතුන් අනුකරණය කරන්නට ගොස් රටට ණය වී තමන්ගේ නිවහන පවා අහිමි වී පරම දරිද්‍ර භාවයට පත් වෙති. ඇතැම්හු මේවා අප විසින් නො කළ යුතු, පහත් අය විසින් කළ යුතු වැඩ යයි තමන් විසින් කළ යුතු වැඩ ද නොකර නො කර හැර දිළිඳු බවට පත් වෙති. ඇතැම්හු ගරු බුහුමන් කළ යුතු ගුණවතුන්ට අගෞරව කොට අවමන් කොට මරණින් පසු අපායට ද යෙති. උම්මත්තකවයා තමාගේ උමතු බව නො පිළිගන්නාක් මෙන් මදය ඇති තැනැත්තා ද තමා මත් වී ඇති බව නො පිළිගනී. එබැවින් මේ මදය නැමති ක්ලේශය දුරු කරවීම දුෂ්කර ය. එය දුරු වන්නේ සත්‍යය වැටහීමෙනි. එය දුරු කරවීමට දිය යුතු බෙහෙත සත්‍ය අවබෝධ කරවීමය. ජාතිගෝත්‍ර වශයෙන් කියන ඒ ඒ අයගේ උසස් පහත් බවෙහි සත්‍යාසත්‍ය භාවය සෙවිය යුතුය. අන් සැමට ම වඩා ජාතියෙන් බමුණන් උසස්ය යනු ඔවුන්ගේ පිළිගැනීමය.

බ්‍රාහ්මණයා උපදින්නේත් රාජ කුමාරයා උපදින්නේත් රදලයා උපදින්නේත් රොඩියා උපදින්නේත් අපවිත්‍ර දෙයින් පිරුණු පරම දුර්ගන්ධයෙන් යුක්ත ස්ත්‍රියකගේ කුසය නැමති අපවිත්‍ර ස්ථානයක ය. උත්පත්තිස්ථානය අනුව ඒ සතර දෙනාගේ වෙනසක් නැත. ඉදින් උසස් ය කියන බ්‍රාහ්මණාදීන් පියුමක හෝ රන් කරඬුවක හෝ රිදී කරඬුවක සඳුන් කරඬුවක හෝ උපදින්නේ නම් ඔවුන්ගේ වෙනසක් ඇත. සැම දෙන ම ගැහැණුන්ගේ කුස වල ම උපදනා බැවින් උත්පත්තියෙන් ඔවුන්ගේ වෙනසක් නැත. බුදුන් වහන්සේ ජාති කුල ගෝත්‍ර අනුව මිනිසුන්ගේ උසස් පහත් බව නොපිළිගන්නාහ. බුදු සස්නෙහි සැමට පැවිද්ද ලැබිය හැකිය. උපසම්පදාව ලැබිය හැකිය. ධ්‍යානාභිඥා මාර්ග ඵල ලැබිය හැකි ය. කරුණු මෙසේ හෙයින් ජාති කුල ගෝත්‍ර අනුව මිනිසුන්ගේ උසස් පහත් බවක් නැති බව කිය යුතුය.

**න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රහ්මණෝ**
**කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණො**
(වසල සූත්‍රය)

ජාතිය නිසා වසලයෙක් පහත් පුද්ගලයෙක් නොවේ. ජාතිය නිසා බ්‍රාහ්මණයෙක් උසස් පුද්ගලයෙක් ද නොවේ. ඒ ඒ තැනැත්තාගේ ක්‍රියා අනුව ම පහත් පුද්ගලයෙක් වේ. උසස් පුද්ගලයෙක් ද වේ.

ඊළඟ සගරාවෙන්...
**03. ආරෝග්‍යමදෝ 04. සොබ්බනමදෝ**

**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ ලිපියක් ඇසුරිනි.**

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය. මීට අමතරව සම ලේකම් වන චින්තක බණ්ඩාර මහතාගේ පුද්ගලික දුරකතන අංකය (0718 114 477) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 37 වන භාවනා වැඩසටහන

**37 වන භාවනා වැඩසටහන 2017 ජූලි මස 16 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2017/06/18 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 33 වන වැඩමුළුව

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 33 වන වැඩමුළුව 2017 - 05 - 07 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 33 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2017 - 04 - 23 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.**


### දෙමළ භාෂාව

පාසල් යන දරුවන් සඳහා **නොමිලේ**
දෙමළ භාෂාව ඉගැන්වීම කරනු ලැබේ.
විජයාරාම විහාරස්ථානයේ දී
සෑම ඉරුදිනක ම
ප.ව. **2.00 - 4.00** දක්වා පැවැත්වේ.
**දුරකථන : 0714486680**
මෙත්සවිය සාමාජිකා - ආලෝකා කුමාරි - 19-3086

### ගණකාධිකරන හා මූල්‍ය සේවා

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිලියෙලකිරීම්,
ආදායම් බදු හා මූල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

### දිදුලක ක්‍රියේෂන්ස්

විසිතුරු නිර්මාණ සමඟින් අලංකාරවත් ලෙස
මුතුකුඩ නිර්මාණය
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
සාරි නිර්මාණය කරනු ලැබේ
සාමජිකා - දිලිනි
බොරලැස්ගමුව - 0773904405

ප්ලාස්ටික් ප්‍රතිශක්තීකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (සා.අංක. **34-5228**) නැගී සිටිමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය
භාර දීමට විමසන්න - **0772 353 392**

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

SIGHT 'N' STYLE OPTOMETRISTS
නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

# මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

01. සම්පූර්ණ නම ..........

02. ස්ත්‍රී / පුරුෂ භාවය .......... 3. ජාතික හැඳුනුම්පත් අංකය ..........

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .......... 5. වයස .......... 6. ආගම ..........

07. ස්ථිර ලිපිනය ..........

විද්‍යුත් තැපෑල (e-mail) .......... දු:ක: නිවස .......... ජංගම ..........

08. දිස්ත්‍රික්කය .......... 9. විවාහක / අවිවාහක බව ..........

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .......... / පිරිමි දරුවන්ගේ වයස් ..........

11. රැකියා කරන්නේ නම්, ආයතනයේ නම .......... තනතුර ..........

(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..........

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..........

13. ලිපි එවිය යුතු ලිපිනය ..........

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ..........

2. ..........

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..........

2. ..........

3. ..........

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..........

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

..........

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..........

..........

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .......... අයදුම්කරුගේ අත්සන ..........

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..........

.......... ..........

තේරීම් කමිටු සභාපති | විධායක ලේකම් | දිනය ..........

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අගහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk



**2017 වසරේ මුල් ම මාසික ධර්ම දේශනය**



පූජ්‍ය ගම්පහ පාසාදික ස්වාමීන්වහන්සේ

## 2016 දෙසැම්බර් 04 වන ඉරු දින මාසික රැස්වීම



මහාචාර්ය
දයාරෝහණ අතුකෝරාළ මහතා
විසින් පැවැත් වූ
**"ජීවිතය ජයගන්නා අන්දම පිළිබඳ
මනෝවිද්‍යාත්මක
පුද්ගල ප්‍රවර්ධන දේශනය"**
කොළඹ 7, ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී...



කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි
**ජයන්ති ළමා නිවාසයේ ළමයින් සඳහා**
## දහවල් දානය සහ අත්‍යවශ්‍යය භාණ්ඩ පරිත්‍යාග කිරීම
**2017 ජනවාරි 01 වන දින සිදු කරන ලදී.**















මෙත් සවියේ සියළුම සාමාජිකයන්ට සෙත් පතා 2017 ජනවාරි 01 වන දින පවත්වන ලද
## අටවිසි බෝධි පූජා පිංකම














2017 ජනවාරි 1 වන දින වසරේ ප්‍රථම

# කේෂධාතූන් වහන්සේ වෙත බුද්ධ පූජාව සහ මහා සංඝ රත්නය විෂයෙහි හීල් දානය

කොළඹ හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයේ දී පවත්වන ලදී.



**මෙම පුණ්‍යකර්මයට දායකත්වය සහ සහයෝගය ලබාදුන් සුපිංවතුනට පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුද කරමු.**
















**මෙම දහම් සඟරාව මුද්‍රණය සඳහා පූර්ණ දායකත්වය ලබාදුන්, මෙත් සවිය සාමාජික මහේන්ද්‍ර ජයනාත් මහතාටත්, දිල්හානි ගුණවර්ධන මහත්මිය සහ චම්පික ගුණවර්ධන මහතා ඇතුළු පවුලේ සැමටත් මෙත් සවිය පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුද කෙරේ**

2/99, ... 011 2827044 / 0712 285 680


# සඳහම් චාරිකාව 2017 පෙබරවාරි 05

# මිහින්තලය කළුදිය පොකුණ ආරණ්‍ය සේනාසනය

## දාන - සීල - භාවනා වැඩසටහන සහ මිහින්තලය ගොවි ජනතාව වෙ




කළුදිය පොකුණ පුදබිමෙහි පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන









ත නොමිලේ ඇස් කන්නාඩි ලබා දීම.


















**2017 මාර්තු 05 වන ඉරුදින කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ පිහිටි නව කලාගාරයේ දී පවැත් වූ...**

*උගත මනා ශිල්පයමයි මතු රැකෙනා*



# සාර්ථකව
## ඉගෙන ගන්නා අන්දම හා
# විභාග සමත්වන ක්‍රම
## පිළිබඳ වැඩමුළුව

























**අධ්‍යාපන වැඩමුළුව සඳහා පාසල් සිසු සිසුවියන් ඇතුළු සාමාජිකයින් 750 කට අධික ප්‍රමාණයක් සහභාගී වන ලදී.**